# පෙරවදන

ශ්‍රී ලංකාව බහු ආගමික හා බහු ජනවාර්ගික රටකි. මෙම බහුත්වය තුළ විවිධ පාර්ශවයන් අතර මත වෙනස්කම් ඇතිවීම වැළැක්විය හැක්කක් නොවේ. නමුත් රටේ සාමය පවත්වාගෙන යන්නට නම් මෙම මත වෙනස්කම් එකිනෙකා අතර වෛරය හා ක්‍රෝධය ඇතිකර ගැනීමේ සාධකයක් බවට පත්කර ගත නොයුතුය. මෙවන් මත වෙනස්කම් ඇතිවන අවස්ථාවන්හි මෙම පාර්ශවයන් අතර අන්‍යෝන්‍ය අවබෝධය තුළින් ප්‍රශ්න සාකච්ඡා කිරීමට කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වන්නේය.

ආගමික හා වාර්ගික කොටස් අතරේ නිරතුරුව මතුවන ප්‍රශ්න විග්‍රහ කිරීම පදනම් කරගෙන සකස්කර ඇති මෙම 'සමාජ සංවාද' ලිපි පෙළ අප සැමගේ අවධානයට යොමු විය යුතු වැදගත් ලිපි පෙළක් ලෙස දකින්නෙමි. සමාජ පාර්ශවයන් අතරේ අර්ථවත් සංවාදයක් සඳහා වූ සාමකාමී දොරටු විවෘත කොට අපගේ ප්‍රශ්න අප අතරේම විසඳා ගැනීමේ මාවතට යොමු කරන වැදගත් ලිපි පෙළක් ලෙස ද මෙය දකින්නෙමි.

මෙහි අන්තර්ගත වැදගත්, යථාර්ථවාදී හා තර්කානුකූල අදහස් අගයකොට සලකමි. උද්වේගය පසෙකලා ශ්‍රී ලාංකිකයින් වශයෙන් අපගේ සාම්ප්‍රදායික බැඳියාවන් හා සහෝදරත්වය ආරක්ෂා කර ගනිමින් අප අතරේ ඇති මත වෙනස්කම් විසඳා ගැනීමට මෙමගින් යහ ආරම්භයක් ඇති කර දී ඇති බව දකින්නට ඇත.

අපගේ මතය හා සමාකාර අයුරින් අන් අය මත දැරිය යුතු යැයි සිතීම සදාචාර සම්පන්න යහ පිළිවෙතක් නොවේ. මා දරණ මතයට පටහැනි මතයක් දැරීමට අන් අයට අයිතියක් ඇති බව රටේ මූලික නීතිය වූ රාජ්‍ය ව්‍යවස්ථාවෙන් ද සහතික කොට ඇත. එහෙයින් සංවාද තුළින් සම්මුතියක් ඇති කර ගැනීමට කටයුතු කරමු. එසේ කිරීමට දුෂ්කරතාවන් ඇති වන අවස්ථාවන්හි දී මගේ මතයට පටහැනි මතයක් දැරීමට අනිකාට පූර්ණ නිදහස හා අයිතියක් ඇතැයි යන මූලික මානව අයිතිවාසිකම් සිද්ධාන්තය පිළිගෙන සාමකාමීව කටයුතු කරන්නට කැප වෙමු. කෙසේ නමුත් මෙම ලිපි පෙළ මගින් අප සැමට නව චින්තන ප්‍රවේශයක් ලබා දී ඇතැයි යන්න පිළිගැනීමට කිසිම අපහසුතාවක් නොමැති බව මාගේ පිළිගැනීමයි.

සමාජ ප්‍රශ්න විසඳා ගැනීමට  උචිතම පිළිවෙත සාමකාමී සංවාද බව මෙම ලිපි පෙළ අපට දැඩි ලෙස අවධාරණය කර සිටී.


ජයං වෙරං පසවති

දුක්ඛං සෙති පරාජිතෝ

උපසන්තෝ සුඛං සෙති

හිත්වා ජය පරාජයං (ධම්ම පදය)

අර්ථය: ජය ගන්නා පුද්ගලයා අනුන්ගේ වෛරය තමා වෙත යොමු කරවයි. පැරදුනු පුද්ගලයා දුකසේ වෙසෙයි. ජය පරාජය දෙකම අත්හැර සංසිඳීමට පත් පුද්ගලයා සුවසේ වාසය කරයි.



ශාස්ත්‍රපති පණ්ඩිත පූජ්‍ය ගලගම ධම්මරංසි හිමිපාණෝ
විහාරාධිපති
ශ්‍රී හත්බෝධි විහාරය
කිරුළ පාර - කොළඹ 05.

# හැඳින්වීම

'සාමය හා සංහිඳියාව වෙත යොමු වූ සමාජ සංවාද' ලිපි පෙළ සකස් කිරීමේ දී අප ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කළේ විවිධත්වයකින් අලංකෘත වූ ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ සුහදත්වය හා සාමූහිකත්වය ගොඩ නැගීමේ උතුම් අරමුණ කෙරෙහිය.

විවිධ ජන වාර්ගික, ආගමික සහ සංස්කෘතික උරුමයන්ගෙන් පෝෂිත වූ අප සමාජය, සාමයේ හා සංහිඳියාවේ මාවතේ අඛණ්ඩව ගමන් කිරීමට නම් සියලු පාර්ශවයන් අතරේ අන්‍යෝන්‍ය අවබෝධය ස්ථාපිත කිරීම අත්‍යාවශ්‍ය සාධකයක් ව පවතී. අන්‍යෝන්‍ය අවබෝධය නොමැති විට එකිනෙකා පිළිබඳ සැකය, අවිශ්වාසය, බිය වැනි හානිකර ප්‍රවනතාවන් ගොඩ නැගෙන්නට ඇති ඉඩකඩ බහුලය. කිසිඳු දහමක් මෙවන් වියවුල් සමාජ තත්ත්වයන් අනුමත නොකරයි. එබැවින් සංවාදී සමාජ සම්බන්ධතාවක් මගින් අන්‍යෝන්‍ය අවබෝධය ස්ථාපිත කොට සමාජ සාමූහිකත්වය ගොඩ නැගීම යුගයේ අවශ්‍යතාවයක් ව පවතී.

එක් එක් දහම් හි වත් පිළිවෙත්, චර්යාවන් මෙන්ම සංස්කෘතික පැතිකඩයන් පිළිබඳව අප සියලු දෙනාම අවබෝධයක් ලබා ගැනීමේ ප්‍රයත්නයක නිරත වීම අත්‍යවශ්‍ය කරුණක් ලෙස දකින්නෙමු. එමෙන්ම සමාජ සංහිඳියාව ශක්තිමත් පදනමකින් ගොඩ නගන්නට නම් සෑම දහමක්ම එම දහමේ වැදගත් ඉගැන්වීම් පිළිබඳව අන් ආගමිකයින් දැනුවත් කිරීම ද වැදගත් වේ.

ඉස්ලාම් දහම මෙන්ම මුස්ලිම් සමාජය පිළිබඳව ද විවිධ වැරදි මත ඇති වී තිබෙන බව අපි ඉතා නිහතමානීව පිළිගන්නෙමු. එම වැරදි මතයන් ගැන කරුණු පහදා දී සත්‍ය තත්ත්වය අවබෝධ කර දීමේ වගකීම අප විසින් අතපසු කොට ඇති බව ද පිළිගන්නෙමු. ප්‍රමාද වී හෝ එම භාරධූර කාර්ය පිළිබඳව යමක් කිරීමට අවස්ථාවක් ලැබීම භාග්‍යයක් කොට සලකන්නෙමු.

මෙම ව්‍යායාමයේ ප්‍රථම පියවර ලෙස 'මාංශ අනුභවය' පිළිබඳ ලිපියක් එළි දැක්වූයෙමු. මෙයත් සමඟ ඔබගේ දෝතට පත්කරනු ලබන්නේ මුස්ලිම් ජනගහන වර්ධනය පිළිබඳව නඟා ඇති චෝදනා ගැන කරුණු පහදා දීමේ වැදගත් ප්‍රකාශනයකි.

මෙය සාධනීය සංවාදයක් සඳහා වූ දොරටු විවෘත කිරීමක් පදනම් කරගත් ලිපි පෙළක් හෙයින් මෙහි අන්තර්ගතයේ ඇති කරුණු පිළිබඳව ඔබගේ අවංක අදහස් දැක්වීම් අපි ඉතා අගය කොට සලකන්නෙමු.

විසංවාදී නොවී සංවාදී සමාජයක් තුළ සියලු කරුණු සාමකාමීව විසඳා ගැනීමට අධිෂ්ඨානශීලීව ක්‍රියා කරන්නට ලක් මවගේ සියලු දරුවන් වන අපි එකට අත්වැල් බැඳ ගනිමු. සෞභාග්‍යයෙන් පිරි සංවර්ධිත ශ්‍රී ලංකාවක් ගොඩ නගන්නට අපගේ පූර්ණ දායකත්වය ලබා දෙමු.


**සැකසුම**

මව්ලවි මුර්ෂිඩ් මුලෆ්ෆර්
මව්ලවි මාහිර් රම්ඩීන්
මව්ලවි ඉර්ෂාද් හිල්මි
මව්ලවි නුඃමාන් ඔමර්

සහෝදර මොහොමඩ් දහලන්
සහෝදර අයාස් සාලිහ්
සහෝදර ෆසාzල් මොහිඩීන්

ඊ-මේල්: teamunityhub@gmail.com

විමසුම් සඳහා: +94 783 330 004, +94 722 009 002

අමතර පිටපත් සඳහා: +94 778 451 919, +94 779 481 919, +94 779 741 919

අන්තර්ජාල: www.unityhub.org

# අන්තර්ගතය


- **ලංකාවේ මුස්ලිම් ජනගහන භීතිකාවට පදනමක් තිබේ ද?**
- **ජනගහන දත්ත**
    - 2012 වාර්ගිකත්වය පදනම් කර ගත් ජනගහන දත්ත
    - වාර්ගික පදනමකින් ජනගහන සැසඳීමක් 1881-2012
    - ආගමික පදනමකින් ජනගහන සැසඳීමක් 1881-2012
    - 1881-2012 බෞද්ධ, මුස්ලිම් පරතරය
    - සිංහල හා මුස්ලිම් සංඛ්‍යාත්මක අගයන් හා එහි පරතරය
- **මුස්ලිම් ජනගහන ප්‍රශ්නය හා මාධ්‍යය**
- **චෝදනා අංක 1**
    - මුස්ලිම් වරුන් සැලසුම් සහගතව තම වර්ගයා සීඝ්‍රයෙන් බෝ කරයි.
    - ජගහනය අඩුවීමට හේතු
        - අධ්‍යාපනය
        - උපත් පාලනය
        - විවාහ වීමේ වයසේ ප්‍රමාදය
        - රජයේ සේවයේ නියුක්ත වීම
        - විදේශ රැකියා
        - මත් ද්‍රව්‍ය භාවිතය
        - ගබ්සා කිරීම
        - උපත් විගස මැරීම
        - සාරධර්ම පිරිහීම
        - පූජක පක්ෂය
        - දශක තුනක බෙදුම්වාදී ගැටුම
- **චෝදනා අංක 2**
    - 1881 සිට මේ දක්වා මුස්ලිම් ජනගහනය වර්ධනය වූ වේගයෙන් සිංහලයන් වර්ධනය වූවා නම් සිංහල ජනගහනය 25.4%ක වර්ධනයක් ලබා තිබිය යුතුය.
- **චෝදනා අංක 3**
    - ව්‍යවහාර වර්ෂ 2040 වන විට මෙරට මහ ජාතිය මරක්කලයින් වෙයි.
- **චෝදනා අංක 4**
    - ත්‍රිකුණාමලය හා වවුනියාව දිස්ත්‍රික්කයන්හි අසාමාන්‍ය මුස්ලිම් ජනගහන වර්ධනය
    - අම්පාර මුස්ලිම් ජනගහන වර්ධනයේ විශේෂත්වයදෙමු.

**ප්‍රශ්නය : 2032 වන විට මුස්ලිම් වරු මහ ජාතිය බවට පත් වී රට ඇල්ලීමට පිඹුරු පත් සකස් කරමින් සිටිති. මෙම තර්ජනයෙන් රට ආරක්ෂා කර ගැනීමට සිංහලයා අවදි කරමු.**

## පැහැදිලි කිරීම

### මුස්ලිම් ජනගහන භීතිකාවට පදනමක් තිබේ ද?

සිංහල ජනයාගේ සිත්සතන් හි මුස්ලිම් වරුන් පිළිබඳ පදනම් විරහිත බියක් ඇති කිරීමේ අරමුණින් මෙම චෝදනාව කලකට පෙර ඉදිරිපත් කරන ලද්දේ ''වර්ෂ 2032 දී මුස්ලිම් ජනයා සිංහල ජනගහනය අබිබවා යන්නේය'' යන ප්‍රචාරය සමගයි. නමුත් මෑතක දී සිංහල වංශය විනාශය අභිමුවට පැමිණ ඇතැයි පවසමින් එළිදැක්වූ පොත් පිංචක ''ව්‍යවහාර වර්ෂ 2040 වන විට මෙරට 'මහ ජාතිය' මරක්කලයින් වෙතැයි ඇතැමෙක් කියති'' යන ප්‍රකාශයෙන් මෙම ප්‍රශ්නය ස්ථිර දැක්මකින් ඉදිරිපත් කොට නොමැති බව පැහැදිලිව දැක ගත හැකිය.

2014 අගෝස්තු 21 වැනි දින 'අද' පුවත්පතේ පළ වූ **''සිංහල ජනතාව බහුතරයක් ලෙස ජීවත් වන අවසන් සියවස මෙයයි''** යන ප්‍රකාශය අනුව මුස්ලිම් වරුන් මහ ජාතිය වන කාලය මෙම ශත වර්ෂයේ අවසානය දක්වා දීර්ඝ කොට ඇති බව පෙනෙන්නට ඇත.

මෙයින් පැහැදිලි වන්නේ සත්‍යයෙන් බැහැර වූ මුස්ලිම් ජනගහන භීතිකාව පිළිබඳ චෝදනා ඉදිරිපත් කරන්නන් අතර පවා ඒ පිළිබඳ එකඟතාවක් හා ආත්ම විශ්වාසයක් නොමැති බවය. මෙම චෝදනා නගන්නන්ගේ තවත් මනඃකල්පිත ප්‍රකාශයක් දෙස අවධානය යොමු කරමු.

2012 වසරේ පොසොන් මස 26 වන දින 'කලම්බු ටෙලිග්‍රාෆ්' වෙත ජෝශප් හැමන්ඩ් විසින් සපයා තිබූ ලිපියක මෙසේ සඳහන් විය. ''නිල වශයෙන් මෙරට මුස්ලිම් ජනගහනයේ ප්‍රතිශතය සමස්ත ජනගහණයෙන් 7% ක් පමණ යැයි ගණන් බලා තිබුණ ද මුස්ලිම් ප්‍රජාව විශ්වාස කරන්නේ එය වැරදි තොරතුරක් බවයි. එය ඇත්ත වශයෙන්ම 17% ක් වත් වී ඇතැයි ඔවුහු විශ්වාස කරති.''

'**මුස්ලිම් ජනගහන භීතිකාව**' මෙවන් එක් එක් අයගේ මනඃකල්පිත මතයන් හා විශ්වාසයන් මත ගොඩ නගා ඇති බව පැහැදිලි වේ.

ඉහත චෝදනාවන් හි යථාර්ථය කුමක් ද යන්න දැන ගැනීමට 2014 සැප්තැම්බර 7 වැනි දින 'රාවය' පුවත් පතේ 11 වැනි පිටුවේ චානුක වත්තේගම මහතා විසින් ''සිංහලයා සුළුතරයක් විය හැකිය කීම **කැත බොරුවකි**'' යන මාතෘකාව යටතේ පළ කොට තිබූ ලිපිය http://ravaya.lk/?p=4166 මාතෘකාව යන වෙබ් සම්බන්ධකයෙන් කරුණා කර කියවා බලන්න.

තවත් මේ පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගනු පිණිස සත්‍ය ජනගහන දත්ත කෙරෙහි අපගේ අවධානය යොමු කරමු.




## ජනගහන දත්ත

ලංකාවේ ජනගහනය පිළිබඳ විධිමත් සංඛ්‍යා ලේඛන දත්ත රැස් කිරීම ආරම්භ වූයේ 1881 දීය. එතැන් පටන් 2012 දක්වා තිබෙන්නා වූ සංඛ්‍යා ලේඛන අපගේ මෙම සාකච්ඡාවට බඳුන් කොට ඇත්තෙමු.

## 2012 වාර්ගිකත්වය පදනම් කර ගත් ජනගහන දත්ත

| සිංහල | ද්‍රවිඩ | යෝනක | බර්ගර් | මැලේ | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 15,173,820 (මිලියන 15.17) | 3,113,247 (මිලියන 3.11) | 1,869,820 (මිලියන 1.86) | 37,061 (මිලියන 0.03) | 40,189 (මිලියන 0.04) | 29,586 (මිලියන 0.03) | 20,263,723 (මිලියන. 20.26) |
| 74.88% | 15.36% | 09.23% | 00.18% | 00.20% | 00.15% | |

**(මූලාශ්‍රය:** http://mawbima.lk/34-43369-news-detail.html)

ඉහත දත්ත අන්තර්ජාතික මූල්‍ය සහයෝගිතා පිළිබඳ ජ්‍යෙෂ්ඨ ඇමැති හා මුදල් නියෝජ්‍ය ඇමැති ආචාර්ය සරත් අමුණුගම මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කරන ලද කරුණු පදනම් කරගෙන සකස් කරන ලද්දකි.

## වාර්ගික පදනමකින් ජනගහන සැසඳීමක් 1881 සිට 2012 දක්වා

| වර්ෂය | සිංහල | | ශ්‍රී ලංකා ද්‍රවිඩ | | ශ්‍රී ලංකා යෝනක | | ඉන්දියානු ද්‍රවිඩ | |
|---|---|---|---|---|---|---|---|---|
| | No. | % | No. | % | No. | % | No. | % |
| 1881 | 1,846,600 | 66.91% | 687,200 | 24.90% | 184,500 | 6.69% | | |
| 1891 | 2,041,200 | 67.86% | 723,900 | 24.07% | 197,200 | 6.56% | | |
| 1901 | 2,330,800 | 65.36% | 951,700 | 26.69% | 228,000 | 6.39% | | |
| 1911 | 2,715,500 | 66.13% | 528,000 | 12.86% | 233,900 | 5.70% | 531,000 | 12.93% |
| 1921 | 3,016,200 | 67.05% | 517,300 | 11.50% | 251,900 | 5.60% | 602,700 | 13.40% |
| 1931 | 3,473,000 | 65.45% | 598,900 | 11.29% | 289,600 | 5.46% | 818,500 | 15.43% |
| 1946 | 4,620,500 | 69.41% | 733,700 | 11.02% | 373,600 | 5.61% | 780,600 | 11.73% |
| 1953 | 5,616,700 | 69.36% | 884,700 | 10.93% | 464,000 | 5.73% | 974,100 | 12.03% |
| 1963 | 7,512,900 | 71.00% | 1,164,700 | 11.01% | 626,800 | 5.92% | 1,123,000 | 10.61% |
| 1971 | 9,131,300 | 71.96% | 1,424,000 | 11.22% | 828,300 | 6.53% | 1,174,900 | 9.26% |
| 1981 | 10,979,400 | 73.95% | 1,886,900 | 12.71% | 1,046,900 | 7.05% | 818,700 | 5.51% |
| 1989 | 12,437,000 | 73.92% | 2,124,000 | 12.62% | 1,249,000 | 7.42% | 873,000 | 5.19% |
| 2011-12 | 15,173,820 | 74.88% | 2,270,924 | 11.21% | 1,869,820 | 9.23% | 842,323 | 4.16% |

**(Source:** Department of Census & Statistics, Sri Lanka)

| වර්ෂය | ශ්‍රී ලංකා මැලේ | | බර්ගර්/යුරේසියන් | | ඉන්දියානු යෝනක | | අනෙකුත් | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | No. | % | No. | % | No. | % | No. | % | No. |
| 1881 | 8,900 | 0.32% | 17,900 | 0.65% | | | 14,500 | 0.53% | 2,759,700 |
| 1891 | 10,100 | 0.34% | 21,200 | 0.70% | | | 14,200 | 0.47% | 3,007,800 |
| 1901 | 11,900 | 0.33% | 23,500 | 0.66% | | | 20,000 | 0.56% | 3,566,000 |
| 1911 | 13,000 | 0.32% | 26,700 | 0.65% | 32,700 | 0.80% | 25,600 | 0.62% | 4,106,400 |
| 1921 | 13,400 | 0.30% | 29,400 | 0.65% | 33,000 | 0.73% | 34,600 | 0.77% | 4,498,600 |
| 1931 | 16,000 | 0.30% | 32,300 | 0.61% | 36,300 | 0.68% | 41,800 | 0.79% | 5,306,000 |
| 1946 | 22,500 | 0.34% | 41,900 | 0.63% | 35,600 | 0.53% | 48,900 | 0.73% | 6,657,300 |
| 1953 | 25,400 | 0.31% | 46,000 | 0.57% | 47,500 | 0.59% | 39,500 | 0.49% | 8,097,900 |
| 1963 | 33,400 | 0.32% | 45,900 | 0.43% | 55,400 | 0.52% | 19,900 | 0.19% | 10,582,000 |
| 1971 | 43,500 | 0.34% | 45,400 | 0.36% | 27,400 | 0.22% | 15,500 | 0.12% | 12,689,900 |
| 1981 | 47,000 | 0.32% | 39,400 | 0.27% | | | 28,400 | 0.19% | 14,846,800 |
| 1989 | 48,000 | 0.29% | 42,000 | 0.25% | | | 52,000 | 0.34% | 16,825,000 |
| 2011-12 | 40,189 | 0.20% | 37,061 | 0.18% | | | 29,586 | 0.14% | 20,263,723 |

## ආගමික පදනමකින් ජනගහන සැසඳීමක් 1881 සිට 2012 දක්වා

| වර්ෂය | බෞද්ධ | | හින්දු | | මුස්ලිම් | | කිතුනු | | අනෙකුත් | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | No. | % | No. | % | No. | % | No. | % | No. | % | No. |
| 1881 | 1,698,100 | 61.53% | 593,600 | 21.51% | 197,800 | 7.17% | 268,000 | 9.71% | 2,300 | 0.08% | 2,759,800 |
| 1891 | 1,877,000 | 62.40% | 615,900 | 20.48% | 212,000 | 7.05% | 302,100 | 10.04% | 800 | 0.03% | 3,007,800 |
| 1901 | 2,141,400 | 60.06% | 826,800 | 23.19% | 246,100 | 6.90% | 349,200 | 9.79% | 2,500 | 0.07% | 3,566,000 |
| 1911 | 2,474,200 | 60.25% | 938,300 | 22.85% | 283,600 | 6.91% | 409,200 | 9.96% | 1,100 | 0.03% | 4,106,400 |
| 1921 | 2,769,800 | 61.57% | 982,100 | 21.83% | 302,500 | 6.72% | 443,400 | 9.86% | 800 | 0.02% | 4,498,600 |
| 1931 | 3,266,600 | 61.55% | 1,166,900 | 21.99% | 354,200 | 6.67% | 518,100 | 9.76% | 1,100 | 0.02% | 5,306,900 |
| 1946 | 4,294,900 | 64.51% | 1,320,400 | 19.83% | 436,600 | 6.56% | 603,200 | 9.06% | 2,200 | 0.03% | 6,657,300 |
| 1953 | 5,209,400 | 64.33% | 1,610,500 | 19.89% | 541,500 | 6.69% | 724,400 | 8.95% | 12,100 | 0.15% | 8,097,900 |
| 1963 | 7,003,300 | 66.18% | 1,958,400 | 18.51% | 724,000 | 6.84% | 884,900 | 8.36% | 11,400 | 0.11% | 10,582,000 |
| 1971 | 8,536,800 | 67.27% | 2,238,600 | 17.64% | 901,700 | 7.11% | 1,004,300 | 7.91% | 8,400 | 0.07% | 12,689,800 |
| 1981 | 10,288,300 | 69.30% | 2,297,800 | 15.48% | 1,121,700 | 7.56% | 1,130,600 | 7.62% | 8,300 | 0.06% | 14,846,700 |
| 2012 | 14,222,844 | 70.19% | 2,554,606 | 12.61% | 1,967,227 | 9.71% | 1,509,606 | 7.45% | 9,440 | 0.05% | 20,263,723 |

**(Source:** Department of Census & Statistics, Sri Lanka**)**


මෙම වගුවෙන් හෙළිදරව් වන තවත් වැදගත් සත්‍යයක් නම් 1881 දී 21.51% ක් වූ හින්දු ජනගහන ප්‍රතිශතය 2012 වන විට 12.61% දක්වා අඩු වී තිබීමය. මෙම හින්දු ප්‍රතිශත අඩුවීම ගණිතමය වශයෙන් අනෙකුත් වාර්ගිකයන්ගේ ප්‍රතිශත වැඩිවීමට බලපෑමක් අනිවාර්යයෙන් සිදු කරන බව ඕනෑම බුද්ධිමත් අයෙකුට පැහැදිලිව අවබෝධ කර ගත හැකි කරුණකි.

මෙම ජනගහන දත්ත සියල්ල සමස්තයක් වශයෙන් සැලකිල්ලට



ගත් විට අසාමාන්‍ය මුස්ලිම් ජනගහන වර්ධනයක් පිළිබඳව නගා ඇති චෝදනා හුදෙක් සිංහල ජනයාගේ සිත්සතන් හි මුස්ලිම් භීතිකාවක් ඇති කිරීමේ අරමුණින් කළ එකක් බව සැකයක් මතු නොවන්නේ ද? විවිධ මාධ්‍යයන් මගින් ද මෙම සත්‍යයෙන් බැහැර වූ චෝදනා හුවා දැක්වීමට කටයුතු කොට ඇත. එයින් එක් උදාහරණයක් ''මුස්ලිම් ජනගහන ප්‍රශ්නය හා මාධ්‍යය'' යන ශීර්ෂය යටතේ පහතින් දක්වා ඇත්තෙමු.

## 1881-2012 බෞද්ධ, මුස්ලිම් පරතරය




**1881 සිට 1981 දක්වා වූ වර්ෂ 100ක් තුළ මුස්ලිම් ජනගහනය වැඩි වී ඇත්තේ (7.56% - 7.17%) = 0.39% කිනි. එම කාල වකවානුව තුළ (69.30% - 61.53%) = 7.77% කින් බෞද්ධ ජනගහනය වර්ධනය වී ඇත.**

ඉහත ප්‍රස්තාරයෙන් නිරූපණය වන්නේ ඒ ඒ සංගණන වර්ෂයන්හි දී සිංහල සහ මුස්ලිම් ජනගහනයන්ය. සිංහල සහ මුස්ලිම් ජනතාවගේ විකාශනය ඒ ඒ රේඛා මගින් නිරූපණය වේ. සිංහල රේඛාව අභිභවා යන්නට මුස්ලිම් රේඛාවට හැකිවේ යැයි සිතීම හුදෙක් පදනම් විරහිත මනඃකල්පිතයක් බව මධ්‍යස්ථභාවයක් ඇති ඕනෑම කෙනෙකුට, **විශේෂයෙන්ම ඕනෑම ජනගහන විශේෂඥයෙකුට හෝ ගණිතඥයෙකුට පැහැදිළිව පෙනී යනු** ඇත. මීළඟට වාර්ගිකත්වයේ සංඛ්‍යාත්මක අගයන් මගින් සිංහල හා මුස්ලිම් ජනගහන පරතරය ක්‍රමානුකූලව වර්ධනය වී ඇති ආකාරය ඉතා පැහැදිලිව දැක ගත හැකිය. ජනගහනය පදනම් කරගෙන කෙලෙස නම් මුස්ලිම් භීතිකාවක් ඇති කර හැක්කේ ද යන්න මෙම දත්තයන් අපෙන් ප්‍රශ්න කර සිටින බව කාට නම් නොපෙනේද?

## සිංහල සහ මුස්ලිම් සංඛ්‍යාත්මක අගයන් හා එහි පරතරය

| සංගණන වර්ෂය | සිංහල | මුස්ලිම | සිංහල, මුස්ලිම පරතරය |
|---|---|---|---|
| 1881 | 1,846,600 | 197,800 | 1,648,800 |
| 1891 | 2,041,200 | 212,000 | 1,829,200 |
| 1901 | 2,330,800 | 246,100 | 2,084,700 |
| 1911 | 2,715,500 | 283,600 | 2,431,900 |
| 1921 | 3,016,200 | 302,500 | 2,713,700 |
| 1931 | 3,473,000 | 354,200 | 3,118,800 |
| 1946 | 4,620,500 | 436,600 | 4,183,900 |
| 1953 | 5,616,700 | 541,500 | 5,075,200 |
| 1963 | 7,512,900 | 724,000 | 6,788,900 |
| 1971 | 9,131,300 | 901,700 | 8,229,600 |
| 1981 | 10,979,400 | 1,121,700 | 9,857,700 |
| 2012 | 15,173,820 | 1,967,227 | 13,206,593 |

## මුස්ලිම් ජනගහන ප්‍රශ්නය හා මාධ්‍යය

පසු ගිය දින වල කොළඹ මුස්ලිම් ජනගහනය වැඩි වීම පිළිබඳ පළ වූ සාවද්‍ය පුවත්පත් වාර්තා වලට ප්‍රතිචාරයක් ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබේ. එය මෙසේය :

"කොළඹ නගරයේ ජනගහනයෙන් වැඩි දෙනා සිංහලයන් වන නමුත්, **'කොළඹ සිංහල ජනගහනය සියයට 24 කට බසී'** යනුවෙන් 2012.12.11 වන දින 'දිවයින' පත්‍රයේ පළ වූ ප්‍රවෘත්තියේ 2012 පූර්ව සංගණන තොරතුරු අනුව කොළඹ නගරයේ සිංහල ජනගහනය සියයට 24 ක්, දෙමළ ජනගහනය සියය 33 ක් සහ මුස්ලිම් ජනගහනය සියයට 40 ක් ලෙස සඳහන් කර තිබීම සාවද්‍ය බවත් එම වාර්තාවේ 1971 ලෙස සඳහන් කර ඇත්තේ 1981 ජන සංගණන තොරතුරු බවත්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව නිවේදනයක් නිකුත් කරමින් කියා සිටී.

කොළඹ නගරය, කොළඹ සහ තිඹිරිගස්යාය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකින් සමන්විත වන අතර කොළඹ නගරය ලෙස ඉහත වාර්තාවෙන් පෙන්වා දී ඇත්තේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි ජනගහනය වන බව එහි සඳහන් වේ. 2012 ජන සංගණනයට අනුව කොළඹ නගරයෙ හි සිංහල ජනගහනය සියයට 36.8 ක්, දෙමළ ජනගහනය (ශ්‍රී ලංකා දෙමළ හා ඉන්දියානු දෙමළ) සියයට 31.8 ක්, ශ්‍රී ලංකා යෝනක ජනගහනය සියයට 29.00 ක් සහ වෙනත් ජන වර්ග වලට අයත් ජනගහනය සියයට 2.4 ක් සිටින බවද දෙපාර්තමේන්තුව තව දුරටත් දන්වා සිටියි."

http://www.divaina.com/2012/12/11/news08.html

http://lankacnews.com/sinhala/news/88161/

ඉස්ලාම් භීතිකාව **(Islamophobia)** වැළඳුනු ඇතැම් ලේඛකයින් විසින් තමන්ගේ මතවාදයන් අලෙවි කිරීමට වැරදි අයුරින් මාධ්‍යය උපයෝගී කර ගන්නා අයුරු දැක ගැනීමට මෙය කදිම නිදසුනක් ලෙස දැක්විය හැක.

## චෝදනා අංක 1

## මුස්ලිම් වරුන් සැලසුම් සහගතව තම වර්ගයා සීඝ්‍රයෙන් බෝ කරයි.

"සිංහල ජනගහන වර්ධන වේගය හා මුස්ලිම් ජනගහන වර්ධන වේගය සැසඳීමේදී මුස්ලිම්වරුන් සැලසුම් සහගතව තම වර්ගයා සීඝ්‍රයෙන් වැඩි කර ගන්නට කටයුතු කරමින් සිටින බව පැහැදිලි වේ."

## පැහැදිලි කිරීම

මෙම චෝදනාව පිළිබඳ විමර්ශනයක යෙදෙන්නට කරුණාකර අප හා එක්වන්න. එම විමර්ශනයේ තොරතුරු පහතින් දක්වා ඇත්තෙමු.

1881 සිට 2012 දක්වා වූ වර්ෂ 130 තුළ මුස්ලිම් ජනගහන වර්ධන වේගයට සාපේක්ෂව සිංහල ජනගහන වර්ධනය සිදු වූවා නම් එහි ප්‍රතිඵලය කෙලෙස විය හැකි දැයි පළමුව විමසා බලමු.

2012 මුස්ලිම් ජනගහනය x 1881 සිංහල ජනගහනය = 2012 විය යුතු සිංහල ජනගහනය
1881 මුස්ලිම් ජනගහනය

$$\frac{1{,}967{,}227 \times 1{,}846{,}600}{197{,}800} = 18{,}365{,}427$$

1881 සිට මුස්ලිම් ජනගහන වර්ධන වේගයට සාපේක්ෂව සිංහල ජනගහන වර්ධනය සිදු වූවා නම් 2012 දී සිංහල ජනගහනය ඉහතින් ගණනය කර ඇති පරිදි 18,365,427 (මි. 18.37) ක් විය යුතුය. වර්තමාන සිංහල ජනගහනය අනුව මෙය (18,365,427 - 15,173,820) = 3,191,607 (මිලියන 3.2) ක අඩුවක් පෙන්නුම් කරයි. මෙම අඩු වීම සම්බන්ධයෙන් ප්‍රධාන හේතූන් මීළඟ පිටුවල දක්වා ඇත්තෙමු.

අනිත් අතින් 1881 සිට 2012 දක්වා වූ සිංහල ජනගහන වේගය අනුව මුස්ලිම් ජනගහන වර්ධනය සිදු වූවා නම් තත්ත්වය කෙලෙසද යන්න සොයා බලමු.

2012 සිංහල ජනගහනය x 1881 මුස්ලිම් ජනගහනය=2012 විය යුතු මුස්ලිම් ජනගහනය
1881 සිංහල ජනගහනය

$$\frac{15{,}173{,}820 \times 197{,}800}{1{,}846{,}600} = 1{,}625{,}356$$

මෙය වර්තමාන මුස්ලිම් ජනගහනයට වඩා (1,967,227 - 1,625,356) = 341,871 ක අඩුවක් පෙන්නුම් කරයි. මෙම උපකල්පනයන් අති මහත් ජනගහන විෂමතාවක් පෙන්නුම් නොකරන බව මධ්‍යස්ත ඕනෑම අයෙකුට පැහැදිලිව පෙනෙන්නට ඇති කරුණකි.

## ජනගහනය අඩු වීමට හේතූන්

1881 සිට 2012 දක්වා වූ වර්ෂ 130 තුළ සිංහල ජනගහනය මෙම කාල වකවානුව තුළ මුස්ලිම් ජනගහන වේගය අනුව වර්ධනය වූවා නම් වර්තමාන ප්‍රමාණයට වඩා මිලියන 3.2 ක වැඩිවීමක් තිබිය යුතු බව ඉහත ගණනය කිරීම් පෙන්නුම් කරයි. මෙම පරතරයේ වෙනසට මුස්ලිම්වරු සැලසුම් සහගතව කටයුතු කර ඇති බවට කිසිදු සාධකයක් නොමැති බව වගකීමෙන් යුතුව අපි ප්‍රකාශ කරන්නෙමු. එය එසේ නොවන්නට වගකිව යුත්තේ මුස්ලිම් ප්‍රජාව ද නැතිනම් වෙනත් සාධක ද යන්න පහතින් විස්තර කර ඇති කරුණු දෙස විචාරශීලීව අවධානය යොමු කිරීමෙන් පැහැදිලි වනු ඇත. පහත කරුණු සිංහල සමාජයට පමණක් බලපාන්නේ යැයි වැරදි මතයක් ඉදිරිපත් කිරීමට ද අපි අකැමැත්තෙමු.

1. අධ්‍යාපනය
2. උපත් පාලනය
3. විවාහ වීමේ වයසේ ප්‍රමාදය
4. රජයේ සේවයේ නියුක්ත වීම
5. විදේශ රැකියා
6. මත් ද්‍රව්‍ය භාවිතය
7. ගබ්සා කිරීම
8. උපන් විගස මැරීම
9. සාරධර්ම පිරිහීම
10. පැවිදි වීම
11. දශක තුනක බෙදුම්වාදී ගැටුම

## 1. අධ්‍යාපනය

"සිංහල කාන්තාවන් අතර දරුඵල අඩුවීමට තවත් හේතුවක් තිබේ. එනම් ඔවුන් අධ්‍යාපනය කෙරෙහි වැඩි බරක් තැබීමයි. සිංහල සමාජයේ පවතින ආකල්පයක් නම් තම දරුවන් හොඳින් ඉගෙනගෙන වෛද්‍යවරයකු හෝ ඉංජිනේරුවකු වනු දැකීමයි. නොඑසේ නම් රජයේ රැකියාවක් කරනු දැකීමයි. එබැවින් උසස් අධ්‍යාපනයෙන් පසු රැකියාවක් ලබාගෙන විවාහ වීමට යෑමේදී තම සාපල්‍යතා වයසින් වැඩි කොටසක් ඒ සඳහා ඔවුනට කැපකිරීමට සිදු වේ. එබැවින් ඔවුන්ට ලැබෙන දරුවන් ප්‍රමාණය අඩු වේ. උගතුන් අතර බෞද්ධ, හින්දු, මුස්ලිම්, කතෝලික භේදයකින් තොරව පවුල් සංවිධාන ක්‍රම අනුගමනය කරන බව පෙනේ. එබැවින් විවාහ වීමේ වයස සහ නූගත්කම ජනගහනය වැඩිවීම සඳහා බලපාන ප්‍රධාන සාධක දෙක ලෙස පෙන්වා දිය හැකිය. ජාති ආගම් භේදයකින් තොරව අප අපේ සමාජය දෙස විවෘත මනසකින් බැලුවහොත් දරුවන් වැඩි ග්‍රාමීය (අඩු වයසින් විවාහ වන) සහ උගත්කමින් අඩු (පාසල් වේලාසනින් හැර යන) සමාජය තුළ බව ඔබට වැටහෙනවා ඇත."

(විශේෂඥ වෛද්‍ය ආරියසේන යූ ගමගේ 27-06-2014 දින 'රිවිර')

"ලංකාවේ ළදරු මරණ හා මාතෘ මරණ සංඛ්‍යාව ඉතාම පහළ බැසීමත්, ජනගහන වර්ධනයෙහි වේගය අඩු වීමත් ජනතාවගේ දැනුම වැඩි වීමේ අතුරු ඵල විය."

(ආචාර්ය ආනන්ද ජයවර්ධන - අංශ ප්‍රධානී, අධ්‍යාපන සමාජ විද්‍යා අධ්‍යයනාංශය, කොළඹ විශ්ව විද්‍යාලය)

(www.divaina.com/2012/10/13/feature01.html)

අධ්‍යාපනික දියුණුව රටක සංවර්ධනයේ ඉතා වැදගත් අවශ්‍යතාවක් වන අතර එහි අතුරු බලපෑමක් ලෙස එය ජනගහන වර්ධනයට සෘණාත්මක බලපෑමක් ඇති වීම ලෝක සම්මතයකි.

ශ්‍රී ලාංකේය මුස්ලිම් ප්‍රජාවගේ අධ්‍යාපනික කටයුතු ජනගහන වර්ධනයට කිනම් අයුරින් බලපෑම් ඇති කර තිබේ ද යන්න සළකා බැලීම වැදගත් කරුණකි. මුස්ලම්වරුන්ට සියලු පහසුකම් සහිත පාසල් පද්ධතියක් නොමැති බව හා අනෙකුත් උසස් ශ්‍රේණියේ පාසල්වලට ඇතුළත් වීමේ දුෂ්කරතාවන් ද ඇත. බොහෝ මුස්ලිම් පාසල්වල සියලු විෂයයන් සඳහා අවශ්‍ය ගුරුවරුන් නොමැති වීම ද මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපනික කටයුතු අඩාල වීමට හේතුවක් වී ඇත. මේ සියලු කරුණුවලින් පෙනෙන්නට තිබෙන්නේ මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපනික කටයුතුවල එක්තරා ප්‍රමාණයක අඩාලවීමක් සිදුවෙමින් පවතින බවය. මෙහි ප්‍රතිඵලයක් ලෙසින් පාසල් හැර යන මුස්ලිම් ශිෂ්‍යයන්ගේ ප්‍රතිශතය අනෙකුත් වාර්ගිකයින් සමඟ සැසඳීමේ දී ඉහළ අගයක් ගනී. අඩු වයසින් විවාහ වීම මුස්ලිම්වරුන් අතර වැඩි වශයෙන් සිදුවීමට මෙය ද එක් ප්‍රධාන හේතුවකි. තවත් වැදගත් කරුණක් වනුයේ සමස්ත විශ්ව විද්‍යාල ශිෂ්‍ය ප්‍රජාව අතර මුස්ලිම් සිසුන්ගේ ප්‍රතිශතය 4% කට වඩා අඩු වීමය. සිංහල සිසුන්ගේ ප්‍රතිශතය ඉතා ඉහළ අගයක් ව ඇත. මුස්ලිම් ප්‍රජාව සඳහා යහ අධ්‍යාපනික සැලැස්මක් ක්‍රියාත්මක කරන්නේ නම් මෙම තත්ත්වය සහමුලින්ම වෙනස් වනු ඇත. ඒ සඳහා වගකිව යුත්තන්ගේ අවධානය යොමු කළ යුතු බව ඉල්ලා සිටින්නෙමු.

## 2. උපත් පාලනය

'පුංචි පවුල රත්තරන්' යනුවෙන් ලංකාවේ පවුල් සැලසුම් ව්‍යාපාරය 1950 ගණන් වල ආරම්භ වූ අතර එහි ව්‍යාප්තිය විශේෂයෙන්ම අසූව දශකයේ දක්නට ලැබුණි. මේ පිළිබඳව විශේෂඥ වෛද්‍ය ආරියසේන යූ. ගමගේ 2014-06-27 දින 'රිවිර' පුවත්පතේ පළ කළ ලිපියෙන් තවත් කොටසක් පහතින් උපුටා දක්වා ඇත්තෙමු.

> ''ශ්‍රී ලංකාවේ අඩුම ජනගහන වර්ධන වේගයක් සටහන් වන්නේ කතෝලිකයන් අතර ය. ඊළඟට පිළිවෙළින් සිංහල, හින්දු සහ මුස්ලිම් ලෙස සඳහන් කළ හැකි ය. කතෝලික පල්ලිය පවුල් සංවිධානයට (ස්වභාවික උපත් පාලන ක්‍රම හැර)විරුද්ධ වුවත් වැඩිම පවුල් සංවිධාන ක්‍රම භාවිත වන්නේ කතෝලිකයන් අතරය. එයට හේතුව කතෝලිකයන් අතර උගත්කම (අධ්‍යාපනය ලැබූවන්ගේ ප්‍රතිශතය) වැඩිවීමය. පැරණි සිංහල සංස්කෘතිය තුළ ද දරුවන් විශාල සංඛ්‍යාවක් තැනීමේ අවශ්‍යතාව තිබුණි. එයට හේතුව වැවත් දාගැබත් මුල්කර ගත් සිංහල බෞද්ධ සංස්කෘතිය ගොඩනැගී තිබුණේ කෘෂිකාර්මික සමාජයක වීමයි. එදා ගොවිතැන් කිරීම සඳහා වැඩි මිනිසුන් ප්‍රමාණයක් සිටීම සම්පතක් විය. වැඩි දරුවන් සංඛ්‍යාවක් සිටින පවුල් ගමේ පොහොසත් සහ බලවත් පවුල් බවට පත්විය. එහෙත් අද සිංහල බෞද්ධයන් අතර පවතින්නේ ඊට හාත්පසින්ම වෙනස් වූ ආකල්පයකි. එනම් 'පින් මඳ පුතුන් සියයක් ලදුවත් නිසරු, ගුණ නැණ බෙලෙන් යුතු පුතුමය ඉතා ගරු' ආකල්පය යි. ඒ කෙසේ වෙතත් සිංහල, දෙමළ හා මුස්ලිම් ජනයා අතර සිටින උගතුන් (ගුරුවරු, ලිපිකරුවන්, වෘත්තිකයන්) දෙස බැලීමේදී පෙනීයන්නේ ඔවුන් අතර පවුල් සංවිධාන කටයුතු වෙනසක් නොමැතිව සම සේ සිදුවන බවය.''

ඉහත කරුණු වලින් සිංහල ජාතියේ ජනගහන වර්ධනයට ඇති තර්ජනය පැහැදිලි වනු ඇතැයි විශ්වාස කරන්නෙමු. තවද වඳ සැත්කම් කර ගන්නා පිරිසගේ ප්‍රතිශතය ද දිනෙන් දින වැඩිවෙමින් පවතී. දැඩි අවශ්‍යතාවයක හේතුවෙන් මිස ස්ථිර වඳ සැත්කම් කර ගැනීම ඉස්ලාමීය නීතිය අනුව තහනම් හෙයින් නොදැනුවත්කමින් මිස මුස්ලිම් කාන්තාවන් මෙම කටයුත්තට ඉදිරිපත් නොවෙති. ස්ථිර වඳ සැත්කමකට දෙන්නා වූ අල්ප මුදලකට ජාතියේ අනාගතය අප විකුණා දැමීමට කටයුතු කිරීම කෙතරම් නින්දනීය දැයි අසන්නට කැමැත්තෙමු.

## 3. විවාහ වීමේ වයසේ ප්‍රමාදය

මෙම වැදගත් කරුණ පිළිබඳව විශේෂඥ වෛද්‍ය ආරියසේන යූ. ගමගේ මහතා විසින් 2014 ජුනි මස 27 වැනි දින 'රිවිර' පුවත්පතේ 'මුස්ලිම් ජනගහනය ඇත්ත හා බොරුව' යන මාතෘකාව යටතේ පළ කළ ලිපියෙන් පහත සඳහන් කොටස උපුටා ගත්තෙමු.

"විද්‍යානුකූලව පෙනී යන තවත් විශේෂ කරුණක් තිබේ. එනම් මුස්ලිම් සමාජය තුළ ජනගහනය වැඩිවීමට ප්‍රධාන හේතුව පවුල් සැලසුම් ක්‍රම භාවිතය නොව මුස්ලිම් කාන්තාවන් අඩු වයසින් විවාහ වීම බවයි. කාන්තාවකට දරුවන් බිහි කිරීමේ හැකියාව ලැබෙන කාල සීමාව සාපලයතා වයස ලෙස හැඳින් වේ. එය සාමාන්‍යයෙන් වයස අවුරුදු පහළොවත් හතළිස් පහත් (15 - 45) අතර කාලය ලෙස දැක්විය හැකිය. එය සාමාන්‍යයෙන් අවුරුදු තිහකි. සිංහල කාන්තාවන්ගේ විවාහ වීමේ වයස පසුගිය දශක කිහිපය තුළ සීඝ්‍රයෙන් ඉහළ ගියත් මුස්ලිම් කාන්තාවන් සඳහා එය එසේ සිදු වුණේ නැත. සිංහල සමාජය තුළ විවාහ වීමේදී කාන්තාවන්ගේ උගත්කමට සහ රැකියාවට වැඩි සැලකිල්ලක් ලැබෙන අතර මුස්ලිම් සමාජය තුළ එම සැලකිල්ල ලැබෙන්නේ කාන්තාවන්ගේ අඩු වයසට සහ රූපාලංකාරයට මිස උගත් කමට නොවේ. නිදර්ශනයක් ලෙස කාන්තාවක වයස අවුරුදු තිහේදී විවාහ වන්නේ නම් ඇයගේ සාපලයතා වයස සියයට පනහකින් අඩු වේ. එනම් වයස අවුරුදු පහළොවේදී විවාහ වූ කාන්තාවක ලබන දරුවන් සංඛ්‍යාව සියයට පනහකින් අඩු වේ. එදා දරුවන් දහදෙනා දොළොස්දෙනා බිහි කළ මව්වරුන් හිටියත් අද එවැනි මව්වරුන් දක්නට නොලැබෙන්නේ විවාහ වීමේ වයස ඉහළ යෑම නිසා මිස පවුල් සැලසුම් භාවිතය පමණක් ම නොවේ."

සමාජ ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු කිරීමේ දී උද්වේගය හෝ අන් වාර්ගිකත්වයක් කෙරෙහි තම සිතෙහි ඇති විරෝධය පදනම් කරගෙන කටයුතු නොකොට බුද්ධිය හා විචාරය පදනම් කරගෙන ක්‍රියා කරන්නේ නම් අපට නිවැරදි නිගමනයන් කරා ළඟා වන්නට පහසු වන බව ඉහත විග්‍රහය අපට පෙන්වා දෙයි.

මේ පිළිබඳව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ මහාචාර්ය මයුර සමරකෝන් මහතා 2013 ඔක්තෝම්බර් මස 29 වැනි දින 'අද' පුවත්පතට ලබාදුන් සම්මුඛ සාකච්ඡාවෙන් තවත් කොටසක් පහතින් උපුටා දක්වා ඇත්තෙමු.

"වර්තමාන සමාජයේ අද තිබෙන ප්‍රධානතම ප්‍රශ්නය තමයි විවාහ සංස්ථාව බලවත් අර්බුදයකට ලක් වී තිබීම. ඒකට සමාජ විද්‍යාත්මකව ප්‍රධාන හේතු කිහිපයක් බලපානවා. විවාහයට අද ලැබිල තියෙන්නෙ ආර්ථික වටිනාකමක්. මේ නිසා විවාහ වීමේ වයස් සීමාව ක්‍රමයෙන් කල් යමින් තිබෙනවා. වර්තමානයේ සමාජය තුළ විවාහ වීමේ සීමා පිරිමියෙකුගේ අවුරුදු 31 - 33 දක්වාත් කාන්තාවකගේ විවාහ වයස් සීමාව අවුරුදු 31 - 32 දක්වා වූ කාල පරාසයකටත් ගමන් කරලා තියෙනවා. නමුත් විවිධ හේතුන් නිසා විවාහයට ඇතුළත් වීම ප්‍රමාද වීම

අනියම් ආකාරයකට සමාජයේ වෙනත් ගැටලු වලට හේතු වෙලා තියෙනවා. උදාහරණයක් ගත්තොත් විවාහ වීමේ වයස් සීමා කල් යන්නේ අධ්‍යාපන හා ආර්ථික හේතු මත. නමුත් පුද්ගලයෙකුගේ කායික හා ලිංගික අවශ්‍යතා කල් දාන්න බැහැ. මෙහි අනියම් ප්‍රතිඵලය වෙලා තියෙන්නෙ අද සමාජය තුළ අනියම් ලිංගික සම්බන්ධතා වැඩිවෙලා තියෙනවා.

මෙම සම්මුඛ සාකච්ඡාව අනුව ද විවාහ වීමේ වයස 31 ඉක්මවන බව සඳහන් වී තිබේ. විවාහ වීමේ වයස ඉහළ යන විට ජනගහනය අඩු වීමට මෙන්ම සමාජයේ සදාචාර ප්‍රශ්න මතු වීමට ද හේතු වී ඇති බව මෙම ලිපිය විග්‍රහ කරයි. මෙය සිංහල ප්‍රජාවගේ අඩු ජනගහන වර්ධන වේගයට බලපාන වැදගත් සාධකයකි.

## 4. රජයේ සේවයේ නියුක්ත වීම

රාජ්‍ය සේවයේ මුස්ලිම්වරු සිටින්නේ 1.5% කට වඩා අඩු පිරිසකි. එයිනුත් ස්වාමි පුරුෂයා හා බිරිය යන දෙදෙනාම රජයේ සේවයේ සිටින්නේ ඉතාම අල්පයකි. නමුත් සිංහල ජනයාගෙන් අති මහත් බහුතරයක් රජයේ සේවයේ සිටිති. එයින් ස්වාමි පුරුෂයා හා බිරිය යන දෙදෙනාම රජයේ සේවයේ සිටින පිරිස ඉතාමත් අධිකය. දෙදෙනාම රජයේ සේවයේ නියුක්ත වීම නිසා දරුවන් ලබා ඔවුන්ව නඩත්තු කිරීමේ කාර්යය ඉතාමත් දුෂ්කර එකක් බවට පත් වී ඇත. රජයේ සේවකයින් මුහුණපාන තවත් ගැටළු කිහිපයක් සඳහන් කරන්නට කැමැත්තෙමු.

වැඩිම කාන්තා ප්‍රතිශතයක් සහිත රජයේ වෘත්තීය ශ්‍රේණියක් වන හෙද සේවාවේ ප්‍රසූත නිවාඩු ලබා ගැනීම ඉතා දුෂ්කර තත්ත්වයට පත්ව ඇත. කාන්තා ප්‍රතිශතය වැඩි තවත් රැකියාවක් වන්නේ ගුරු වෘත්තියයි. අපගේ නිරීක්ෂණයට අනුව දරුවන් ලැබීම වැඩියෙන්ම අධෛර්ය කරන ක්ෂේත්‍රයක් වන්නේ ද ගුරු වෘත්තියයි. රැකියා කරන කාන්තාවක් ප්‍රසූත නිවාඩු ලබා ගැනීම වරදක් සේ සලකන තත්ත්වයක් මුළු සමාජය තුළම පවතී. මෙවන් තත්ත්වයක් තුළ ජනගහන වර්ධන වේගය කෙසේ නම් වැඩි කර ගත හැකි වන්නේ දැයි කරුණාකර සිතා බලන්න.

රාජ්‍ය සේවකයින් මුහුණපාන මෙම ප්‍රශ්න සිංහල ජනගහන වර්ධනය අඩු වීමට ඉතා වැදගත් අයුරින් බලපා ඇති බව සැවොම දන්නා කරුණකි. ජනගහන වර්ධන වේගය වැඩි කර ගන්නට නම් මෙම ප්‍රශ්න සියල්ල පිළිබඳව කඩිනම් විසඳුම් අවශ්‍යව ඇත.

## 5. විදේශ රැකියා

"කාන්තාවන් විදේශගත වීම ද දරුවන් බිහිකිරීම (ජනගහනය) අඩු වීමට තවත් හේතුවකි. මෙසේ විදේශ ගත වන කාන්තාවන්ගෙන් බහුතරය සිංහල සහ දෙමළ මිස මුස්ලිම් අය නොවෙන බව ද සැලකිල්ලට ගත යුතුව තිබේ. විදේශ ගත වන බොහෝ කාන්තාවෝ අවිවාහකයෝ ය. සිංහල සහ දෙමළ බොහෝ කාන්තා-වන් විදේශ ගත වන්නේ තමන්ට විවාහ වීම සඳහා අවශ්‍ය කරන මුදල්හදල් (දෑවැද්ද) සොයා ගැනීම සඳහා ය. ඔවුන් විදේශ ගත වී මුදල්හදල් සොයාගෙන ගෙවල් දොරවල් වැඩිදියුණු කර ටිවී, කැසට්, ශීතකරණ යනාදිය මිලදී ගෙන, කනකර ආභරණ සකසාගෙන දෑවැද්ද සඳහා ද මුදලක් ඉතිරි කර ගන්නා විට ඇයගේ සාපලයතා වයසින් හරි අඩකටත් වඩා ගෙවී ගොස් හමාරය".

(විශේෂඥ වෛද්‍ය ආරියසේන යූ ගමගේ 27-06-2014 දින 'රිවිර')

කාන්තාවන් පමණක් නොව විදේශ රැකියා සඳහා රටින් බැහැරව සිටින පිරිමින්ගෙන් ද බහුතරය සිංහල ජනයා බව අප සැවොම දන්නා කරුණකි. මෙම කරුණු සියල්ල සිංහල ජනගහන වර්ධන වේගය අඩු කිරීමට හේතු වී ඇති බව පැහැදිලිව පෙනෙන්නට ඇති සාධකයන් ය.

## 6. මත් ද්‍රව්‍ය භාවිතය

2014 මාර්තු 14 වැනි දින 'මව්බිම' පුවත්පතේ පළ වූ වාර්තාවක් කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවන්නට කැමැත්තෙමු.

**"මත් ද්‍රව්‍ය භාවිතයෙන් දිනකට 360 ක් මරුට"**

**"ලංකාවේ දිනකට 1200 ක් උපදිනවා - දිනකට 1000 ක් මැරෙනවා"**
**"ඒ දාහෙන් 600 ක් මැරෙන්නේ බෝ නොවන රෝගවලින්"**
**"ඒ 600 න් 360 ක් මැරෙන්නේ මත් ද්‍රව්‍ය භාවිතය නිසා වැළඳෙන රෝග වලින්"**
**"සෞඛ්‍ය ඇමති මෛත්‍රිපාල හෙළි කරයි."**

මත් ද්‍රව්‍ය භාවිතය මුස්ලිම් ජනයා අතර නොමැත්තේයැ'යි පවසන්නට තරම් සත්‍යය තත්ත්වයෙන් බැහැර වූ ප්‍රකාශයක් කරන්නට කිසිවෙකුට නොහැක. නමුත් මත් ද්‍රව්‍ය භාවිතය මුස්ලිම් ජනයා අතර ඇත්තේ ඉතාම අවම මට්ටමකින් බව වගකීමකින් යුක්තව පවසන්නට කැමැත්තෙමු. දිනකට මේ හේතුවෙන් මිය යන සංඛ්‍යාව අතර බහුතරය කවුරුන්දැයි අමුතුවෙන් අටුවා ලියන්නට අවශ්‍ය නොවේ.

මෙවන් සමාජ ප්‍රශ්න සම්බන්ධයෙන් අවශ්‍යව ඇත්තේ එකිනෙකාට එරෙහිව පදනම් විරහිත චෝදනා නගමින් සිටින්නේ නැතිව ශ්‍රී ලාංකික සැමගේ සාමූහික ප්‍රයත්නයක් මගින් වහාම විසඳුම් කරා යොමුවීම නොවේදැයි අසන්නට කැමැත්තෙමු.

## 7. ගබ්සා කිරීම

**2012 ජූනි මස 17 දින 'ලංකාදීප' පුවත්පතේ පළ වූ සවිස්තරාත්මක වාර්තාව කෙරෙහි ද අපගේ අවධානය යොමු කරමු.**

"කැලණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ ආචාර්ය වසන්තා සුබසිංහ විසින් ගබ්සාව පිළිබඳව සිදු කරන ලද පර්යේෂණයන් හි දත්ත පදනම් කොට ගෙන මෙම ලිපිය සැකසේ. නිල නොලත් වාර්තා වලට අනුව දිනකට 800-1000 ත් අතර ප්‍රමාණයක් නීති විරෝධී ගබ්සා සිදු වේ. ගබ්සාව පිළිබඳව පළමු පර්යේෂණය සිදු කරන ලද්දේ 1998 දීය. එයින් හෙළිදරව් වූ කරුණක් නම්, ලංකාවේ වසරකට සිදු වන දරු උපත් ප්‍රමාණය 3,75,000කට ආසන්න වන බවයි. නමුත් ලක්ෂ තුන ඉක්මවා ප්‍රමාණයක් ගබ්සා සිදුවීම බරපතල අර්බුදයක් බවට පත්ව ඇත. ගණනය කිරීම මගින් දක්නට ලැබෙන ප්‍රශ්නය මෙය වුවත් මින් එහා ගිය සමාජ ප්‍රශ්න රැසක් නීති විරෝධී ගබ්සාව නිසා දැකිය හැකිය."

ඉහත වාර්තාව අපට හඬ නගා පවසන්නේ කුමක් ද? මෙරට ගබ්සා මධ්‍යස්ථාන අති විශාල ප්‍රමාණයක් ඇති බව නිතර මාධ්‍යයන් මගින් දකින්නෙමු. එබැවින් ගබ්සා මධ්‍යස්ථාන වල විනාශ කර දමන අති විශාල ජීවිත සංඛ්‍යාව බේරා ගැනීමට අප සැවොම සාමූහික උත්සාහයක යෙදෙන්නේ නම් ජනගහන ප්‍රස්ථාරයේ සිදු විය හැකි වෙනස අති මහත්ය. අප එකිනෙකාට චෝදනා නගමින් කටයුතු කරන්නේ නැතිව මෙම අති මහත් ජීවිත සංඛ්‍යාව බේරා ගන්නට කටයුතු කරන්නේ නම් විශේෂයෙන් ම සිංහල ජනගහන වර්ධන වේගයේ අති විශාල වෙනසක් සිදුවෙනවාට කිසිම සැකයක් නොමැත. මුස්ලිම් ජනගහන වර්ධන වේගයට සාපේක්ෂව වසර 130 ක දී සිංහල ජනගහනය අඩු වී ඇත්තේ මිලියන 3.2 ක් වැනි ප්‍රමාණයකිනි. නමුත් **මෙම ගබ්සා කිරීම් වළක්වා ගැනීමට හැකි වුවහොත් අවුරුදු 8ක් වැනි කෙටි කාලයක් තුළ අවුරුදු 130ක් තුළ අඩු වූ මෙම මිලියන 3.2 ට වඩා අධික ලෙස ජනගහනය වර්ධනය කර ගැනීමට හැකි වෙනවා යන්න ඕනෑම අයෙකුට පිළිගත හැකි කරුණක් නොවන්නේදැයි විමසන්නට කැමැත්තෙමු.** අමු අමුවේ මරා දමනු ලබන මෙම ජීවිත බේරා ගැනීමට සාමූහික ව කටයුතු කරමුයි ඉල්ලා සිටින්නට කැමැත්තෙමු.

## 8. උපන් විගස දරුවන් මරා දැමීම

ගබ්සාවට වඩා භයානක සමාජ පිළිලයක් බවට පත් ව ඇත්තේ උපන් හැටියේ බිළින්දන් මරා දැමීමේ කෲර ක්‍රියාවයි. මෙම සමාජ ප්‍රශ්නය පිළිබඳව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ මහාචාර්ය මයුර සමරකෝන් මහතා සමග 'අද' පුවත්පතේ පාලිත ආරියවංශ මහතා විසින් පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවේ වාර්තාව 2013 ඔක්තෝම්බර් මස 29 වැනි දින 'උපන් හැටියේ දරුවන් මරා දමන්නේ ඇයි' යන මාතෘකාව යටතේ එම පුවත්පතේ පළ කොට තිබිණි. එම වාර්තාවෙන් උපුටා ගත් කොටස් පහතින් දක්වා ඇත්තෙමු.

''ලෝක ළමා දිනය සමරන්න මුළු රටම සූදානම් වී සිටියදී ඊට දින තුනකට පෙර බදුලු වැසියන්ට දක්නට ලැබුණේ ඉතා දුක්බර දසුනකි. බදුල්ල දුම්රිය ස්ථානයට නුදුරින් පිහිටි ගුවන් පාලමේ පඩියක් මත තිබුණේ මළ සිරුරකි. මේ කිරිකැටියා රෙදි කඩකින් ඔතා තිබුණේය. හිමිදිරි පාන්දරම මේ ඛේදජනක දසුන දැක තිබුණේ මෙම පාලම මතින් ගමන් කළ ගම් වැසියෙකි. බිළිඳු සිරුර පිරිමි දරුවෙකුගේය. බදුල්ල පොලිසියට ලැබුණු දුරකථන පණිවිඩයක් අනුව බදුල්ල පොලිසිය පරීක්ෂණ ආරම්භ කළහ.

බදුල්ල මහේස්ත්‍රාත් වරිය එම ස්ථානයට පැමිණ බිළිඳු මළ සිරුර පරීක්ෂා කර එය පශ්චාත් මරණ පරීක්ෂණයකට ලක් කරවීමටත් වැඩිදුර පරීක්ෂණ පවත්වා සැකකාරිය අත්අඩංගුවට ගැනීමටත් නියෝග කළාය. එම නියෝගය ලැබී පැය කිහිපයක් ගත වෙද්දී බදුල්ල පොලිසියට තවත් තොරතුරක් ලැබුණේය. ඒ හාලිඇල ක්වීන්ස් ටවුන් වත්තේ ගැබිනියක් ව සිටි කාන්තාවක් පිළිබඳවය. එම සැකකාරිය අත් අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමේදී අනාවරණය වුයේ වෙනත් බිළිඳු විපතක් ගැනය. අවිවාහක කාන්තාවක් වූ ඇය බිහි කළ දරුවා උපන් හැටියේ වළ දමා තිබිණි. උපන් හැටියේ බිළිඳා ඝාතනය කර හෝ නොකර ගෝනි කැබැල්ලක ඔතා වළ දමා තිබුණේ ඇගේ නිවසේ මුළුතැන් ගේ ආසන්නයේ පිහිටි කෙසෙල් පඳුරක් යටය."

උපන් හැටියේ දරුවන් ඝාතනය කරන සිද්ධීන් පසුගිය කාලය පුරා දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් අසන්නට ලැබිණ. අම්මලා තම කුසින්ම බිහි කළ දරුවන් මෙසේ ඝාතනය කරන්නේ ඇයි දැයි යන ප්‍රශ්නයට විසඳුම් සොයා දීම අද දවසේ සමාජ වගකීමකි. අපි මේ පිළිබඳව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ මහාචාර්ය මයුර සමරකෝන් මහතාගෙන් විමසුවෙමු."

උපන් හැටියේ දරුවන් මරා දැමීමේ සංස්කෘතිය ක්‍රමයෙන් වර්ධනය වෙමින් පවතින බව මෙම ලිපියේ අඩංගු කරුණු වලින් පැහැදිලිව පෙනෙන්නට ඇති සාධකයකි. මෙය අති සාහසික කෲර ක්‍රියාවකි. මෙම අති පිළිකුල් සහගත ක්‍රියාව ජනගහන වර්ධනය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳව විමර්ශනය කර බැලීමේ අවශ්‍යතාව මතු වී ඇත.

## 9. සාරධර්ම පිරිහීම

2013 අගෝස්තු 16 වැනි සිකුරාදා 'මව්බිම' පුවත්පතේ පහත සඳහන් ප්‍රවෘත්තිය වාර්තා කොට තිබුණි.

**'ලංකාවේ දිනකට 1,40,000 ක් අනාචාරයේ හැසිරෙනවා'**
**'සමලිංගිකයින් 10% කින් වැඩිවෙලා'**
**'සමීක්ෂණයකින් හෙළි වෙයි'**

"ශ්‍රී ලංකාවේ දිනකට පුද්ගලයන් එක් ලක්ෂ හතළිස් දහසක් අභිසරුලියන් සමග සහ අනියම් සබඳතා මත අනාරක්ෂිත ලිංගික සබඳතා වල යෙදෙන බව සමීක්ෂණයක දී හෙළි වී තිබේ. ලිංගාශ්‍රිත රෝග සහ ඒඩ්ස් මර්දන ව්‍යාපාරයේ අධ්‍යක්ෂක වෛද්‍ය සිසිර ලියනගේ මහතා සඳහන් කළේ රාජ්‍ය නොවන සංවිධාන වල සහය මත කරන ලද සමාජ සමීක්ෂණයක දී මේ බව හෙළි වී ඇති බවය".

මෙම වාර්තාව අනුව දරුවන් බිහි කිරීමේ කාර්යයට බාධක දෙකක් පැහැදිලිව දක්නට ඇත. අනාචාරයේ හැසිරෙන්නන් දරු සම්පතක් අපේක්ෂාවෙන් කටයුතු කරන්නන් නොවීම පළමු බාධකයයි. ඔවුන් පැහැදිලිවම සදාචාර විරෝධීව තමන්ගේ ලිංගික ආශාවන් සංසිඳුවා ගැනීමට කටයුතු කරන්නන් හා කරන්තියන් පමණි. බොහෝ විට මෙහි මූල්‍යමය අපේක්ෂාවන් තිබිය හැක. අනෙක් බාධාව සමලිංගිකයින්ගේ වැඩි වීමය. මෙම පිරිස ද ජනගහන වර්ධනයට කිසිසේත්ම දායක වන්නන් නොවේ.

## 10. පැවිදි වීම

"මුස්ලිම් සමාජය තුළ පූජක වරුන් (බෞද්ධ ස්වාමින් වහන්සේලා හෝ පල්ලියේ පියතුමන්ලා මෙන්) නැතිවා මෙන්ම පල්ලියේ ආගම දේශනා කරන මවුලව්වරු ද විවාහ වී සාමාන්‍ය දිවි පෙවෙතක් ගෙවන පුරවැසියෝය. එබැවින් පූජ්‍ය පක්ෂයට ඇතුළු වී විවාහ නොවීම නිසා ජනගහනය බෝවීම අඩුවීම පිළිබඳ ගැටලුවක් ද මුස්ලිම් සමාජය තුළ දක්නට නො ලැබේ."

(විශේෂඥ වෛද්‍ය ආරියසේන යූ. ගමගේ 2014-06-27 දින 'රිවිර')

## 11. දශක තුනක බෙදුම්වාදී ගැටුම

දශක තුනක් තිස්සේ පැවති අවාසනාවන්ත බෙදුම්වාදී ගැටුම් හේතුවෙන් ද්‍රවිඩයින් විශාල ප්‍රමාණයක් ද සිංහල ජනයා එයට ආසන්න ප්‍රමාණයකින් ද දිවි පිදූ බව අප සැවොම හොඳින් දන්නා කරුණකි. මුස්ලිම්

ජනයා ද මෙම ගැටුමේ දී දිවි පිදූ නමුත් ගැටුමේ සෘජු පාර්ශව කරුවෙකු වූ ද්‍රවිඩ ජනයා හා වැඩි ජනගහන ප්‍රතිශතයක් ඇති සිංහල ජනයාගේ අනුපාතයට සාපේක්ෂව එය සමීප වූවක් නොවන බව සත්‍යයකි. සන්නද්ධ හමුදාවන් හි අති විශාල ප්‍රමාණයක සිංහල සොල්දාදුවන්ගේ ජීවිත පරිත්‍යාගය ද මෙහි දී සැලකිල්ලට ගත යුතුව ඇත. මෙම ගැටුම් කාල වකවානුවේ හා ඉන් පසුව අති විශාල ද්‍රවිඩ පිරිසක් විවිධ රටවල් වලට සංක්‍රමණය වීම ද තවත් වැදගත් සාධකයකි.

ඉහත සියලු කරුණු දෙස විවෘත මනසකින් හා පූර්ව නිගමනයන්ගෙන් තොරව විචාර බුද්ධිය මෙහෙයවා කරන විමසුමක යෙදෙන ඕනෑම අයෙකුට පෙනෙන්නට ඇති සත්‍යය කුමක් ද? මුස්ලිම් ජනයා තම ජනගහනය සැලසුම් සහගතව වැඩි කර ගනිමින් ශ්‍රී ලංකාවේ බහුතරය වීමට ක්‍රියා කරමින් ඉන්නේ යැයි නගන චෝදනාව අබමල් රේණුවක තරම්වත් හරයක් නැති සහමුලින්ම පදනම් විරහිත එකක් බව නොවේද?

## චෝදනා අංක 2

"1881 ආරම්භක සිංහල ජනගහනය වූ 1,846,600 ට සාපේක්ෂව 2012 සිංහල ජනගහනය 15,173,820 යනු මුල් ජනගහනය 8.22 ගුණයකින් වැඩි වීමකි (822% ක වර්ධනයකි). ශ්‍රී ලාංකීය දෙමළ ජනගහනය වර්ධනය වී ඇත්තේ 3.3 ගුණයකිනි (330% ක වර්ධනයකි). ඉන්දීය දෙමළ ජනගහනය වර්ධනය වී ඇත්තේ 1.5 ගුණයකිනි (159% ක වර්ධනයකි). එහෙත් මුස්ලිම් ජනවර්ගය 10.13 ගුණයකින් වර්ධනය වී ඇත. (1013% ක වර්ධනයකි). 1881 දී සිංහල ප්‍රතිශතය 66.91% ව පැවතියද වසර 130 කට පසු අප ජනසංයුතිය වර්ධනය කරගෙන ඇත්තේ 7.97% කිනි. එහෙත් 1881 දී 6.69% වූ මුස්ලිම් ප්‍රජාව 2012 වන විට සිය ජනගහන 2.54 කින් ඉහළ නංවාගෙන ඇත. ජන අනුපාතයට සමානුපාතිකව මෙම 2.54% ක වර්ධනය 7.97% ක වර්ධනයට වඩා විශාලය. මෙම තර්කය තේරුම් ගැනීම පහසු වීම සඳහා මෙසේ ප්‍රකාශ කරමු. 1881 සිට මේ දක්වා මුස්ලිම් ජනගහනය වර්ධනය වූ වේගයෙන් සිංහලයන් වර්ධනය වූවානම් සිංහල ජනගහනය 25.4% ක වර්ධනයක් ලබා තිබිය යුතුය. එහෙත් වර්ධනය වී ඇත්තේ 8% කින් පමණි."

## පැහැදිලි කිරීම

ඉහත ප්‍රකාශනයේ උපකල්පනයන් කිහිපයක් ඇති අතර ඉදිරිපත් කොට ඇති සමහර තොරතුරු වල නිවැරදි බවක් නොපෙනේ. එම තොරතුරු නිවැරදි යැයි උපකල්පනය කළ ද පහතින් විග්‍රහ කොට ඇති පරිදි ඒවා යථාර්ථවාදී නොවන බව පැහැදිලිවම පෙනෙන්නට ඇත. මෙහි තවත් වැදගත් සාධකයක් අතහැර ඇති බව අපි දකින්නෙමු. එනම් 25.4% ක සිංහල ජනගහන වර්ධනයක් සඳහන් වුව ද එහි අවසාන ප්‍රතිඵලය වශයෙන් සම්පූර්ණ ජනගහනය ගණනය කිරීමට ඔවුන් අතපසු කිරීම සැබැවින්ම ප්‍රශ්නාර්ථයකි. එසේ නොකර සිටීමට

හේතුව මෙම උපකල්පනයේ යථාර්ථවාදී බවක් නොමැති බව ඔවුන්ටම පෙනී ගොස් ඇති නිසා දැයි අපට සිතන්නට සිදු වී ඇත.

මුස්ලිම් ජනගහනයට සාපේක්ෂව සිංහල ජනගහනයේ වර්ධනයක් සිදු වූවා නම් 1881 වූ සිංහල ජනගහනය 2012 වන විට 25.4% කින් වැඩි වී තිබිය යුතුය යන්න ඉහත තර්කයයි. එහි සත්‍යය සංඛ්‍යාත්මක වර්ධනය කුමක් ද යන්න විමසා බලමු.

$$\frac{1881 \text{ සිංහල ජනගහනය } \times 25.4}{2012 \text{ සිංහල ජනගහන වර්ධන ප්‍රතිශතය}} = 25.4\% \text{ ක වර්ධනය}$$

$$\frac{15{,}173{,}820 \times 25.4}{7.97} = 48{,}358{,}222$$

2012 සංගණනයට අනුව රටේ සිටි මිලියන 15.17 ක් වූ සිංහල ජනගහනය 25.4% කින් 1881 සිට 2012 දක්වා වර්ධනය වී තිබුනා නම් එම වර්ධනයේ ප්‍රතිඵලය අනුව සිංහල ජනගහනය 48,358,222 (මිලියන 48.36) ක් විය යුතුය. මෙම සිංහල ජනගහනයට අනෙකුත් වාර්ගිකයින්ගේ 5,089,903 (මිලියන 5.10) ක් වූ ජනගහනය එකතු කළ විට ශ්‍රී ලංකාවේ මුළු ජනගහනය 53,448,125 (මිලියන 53.45) ක් විය යුතුය. මෙම ජනගහනය 2032 හෝ 2040 හෝ ශ්‍රී ලංකාවේ ඇති විය හැක්කක් නොවන බව බුද්ධිමත් ඕනෑම අයෙකුට පැහැදිලිව අවබෝධ කරගත හැකි සත්‍යයකි.

පදනම් විරහිත මෙවන් මනඃකල්පිත සංඛ්‍යාවන් ඉදිරිපත් කරමින් මුස්ලිම් වරුන් පිළිබඳව භීතියක් ඇති කිරීමට කටයුතු කිරීම කිසිසේත්ම සදාචාර සම්පන්න ක්‍රියාවක් නොවන බව ඕනෑම අයෙකුට පැහැදිලිවන කරුණකි. මේ පිළිබඳ නිවැරදි ගණනය කිරීම් චෝදනා අංක 1 යටතේ විග්‍රහ කොට ඇත්තෙමු.

## චෝදනා අංක 3

**"වර්ෂ 2032 දී මුස්ලිම් ජනයා සිංහල ජනගහනය අභිබවා යයි."**
**"ව්‍යවහාර වර්ෂ 2040 වන විට මෙරට මහ ජාතිය මරක්කලයින් වෙයි."**
**"සිංහල ජනතාව බහුතරයක් ලෙස ජීවත්වන අවසන් සියවස මෙයයි."**

### පැහැදිලි කිරීම

මුස්ලිම් ජනගහන වර්ධන භීතිකාව පිළිබඳ ඉදිරිපත් කොට ඇති චෝදනාවට පදනම් වූ ප්‍රධාන ප්‍රකාශනයන් මේවාය.

මුස්ලිම් වරුන් අනාගතයේ දී බහුතරයක් වන්නේය යන චෝදනාව මතු කර ඇත්තේ වර්තමාන ජනගහන වර්ධන වේගය පදනම් කර ගෙනය. එහෙයින්

එම කරුණට අදාළ තොරතුරු ද විමසා බලමු. පළමුව 1881 සිට 2012 දක්වා වූ වර්ෂ 130 තිස්සේ එක් එක් වාර්ගිකයින්ගේ ජනගහන වර්ධන වේගය හා ඒ අනුව වර්ෂ 2032, 2040 හෝ 2100 දී එම වාර්ගිකයින්ගේ ජනගහනය කුමක් විය හැකි ද යන්න අපට ගණනය කළ හැකිය. එසේ වෙන් වෙන්ව ගණනය කිරීමට පෙර 2050 දී එනම් 2012 සිට ඉදිරි වර්ෂ 38 අවසානයේ දී එය කෙලෙස විය හැක්කේ ද යන්න විමසා බැලීමෙන් කුමන වර්ෂයේ වුව ද තත්ත්වය අවබෝධ කර ගැනීමට පහසු වනු ඇත.

මෙම ජනගහන ගණනය කිරීම් සඳහා වෙනත් පිළිගත් පදනමක් නොමැති තත්ත්වය තුළ ගණිතමය පදනමකින් මෙය කර ඇත්තෙමු. මේ සඳහා වෙනත් විකල්ප පදනමක් යෝජනා කළ හැකි නම් එය ද සලකා බලන්නට කැමැත්තෙමු.

**වර්ෂ 130 තුළ සිංහල වර්ධන වේගය** 2012 ජනගහනය / 1881 ජනගහනය = $\frac{15,173,820}{1,846,600} = 8.217$

**එක් වර්ෂයක සාමාන්‍ය වර්ධන වේගය** = $\frac{8.217}{130} = 0.063$

**මේ අනුව 2050 දී සිංහල ජනගහනය** = 2012 ජනගහනය X 0.063 X 38
= 15,173,820 X 0.063 X 38 = 36,326,125
= මිලියන 36.33

**වර්ෂ 130 තුළ මුස්ලිම් වර්ධන වේගය** 2012 ජනගහනය / 1881 ජනගහනය = $\frac{1,967,227}{197,800} = 9.946$

**එක් වර්ෂයක සාමාන්‍ය වර්ධන වේගය** = $\frac{9.946}{130} = 0.0766$

**මේ අනුව 2050 දී මුස්ලිම් ජනගහනය** = 2012 ජනගහනය X 0.0766 X 38
= 1,967,227 X 0.063 X 38 = 5,681,352
= මිලියන 5.68

**වර්ෂ 130 තුළ ද්‍රවිඩ වර්ධන වේගය** = 2012 ජනගහනය / 1881 ජනගහනය = $\frac{3,122,676}{715,400} = 4.365$

**එක් වර්ෂයක සාමාන්‍ය වර්ධන වේගය** = $\frac{4.365}{130} = 0.034$

**මේ අනුව 2050 දී ද්‍රවිඩ ජනගහනය** = 2012 ජනගහනය X 0.034 X 38
= 3,122,676 X 0.034 X 38 = 4,034,497
= මිලියන 4.03

මෙම ගණනය කිරීම් අනුව 2050 දී පවා මහ ජාතිය සිංහල වන අතර එය මිලියන 36.33 ක් වනු ඇත. 2050 දී මුස්ලිම් හා ද්‍රවිඩ ජනගහනයන් පිළිවෙලින් මිලියන 5.68 ක් හා මිලියන 4.03 ක් වනු ඇත. 2050 දී සමස්ත ජනගහනය (36.33 + 5.68 + 4.03) = මිලියන 46.04 ක් වනු ඇත.

ඉහත චෝදනාව අනුව 2032 හෝ 2040 හෝ ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 46.04 ක් වීම යථාර්ථයක් නොවන බව පෙනේ. එහෙයින් වඩාත් යථාර්ථය සමග සමීපතාවක් ඇති වර්ධන වේගය කුමක් ද යන්න පිළිබඳව අපට අවධානය යොමු කරන්නට සිදු වී ඇත.

**1881 සිට 2012 දක්වා සමස්ත ජනගහන වර්ධන ප්‍රතිශතය**

$$= \frac{\text{(2012 ජනගහනය - 1881 ජනගහනය)}}{\text{1881 ජනගහනය}} \times 100$$

$$= \frac{(20,263,723 - 2,759,800)}{2,759,800} \times 100 = 634\%$$

**1881 සිට 2012 දක්වා අවුරුදු 130 ක වාර්ෂික වර්ධන ප්‍රතිශතය**

$$= \frac{634}{130} = 4.88\%$$

වඩාත් තාත්වික ගණනය කිරීමක් සඳහා 1881 සිට 2012 දක්වා වාර්ෂික වර්ධන ප්‍රතිශතයට වඩා 1981 සිට 2012 දක්වා ජනගහන වර්ධනයේ එක්තරා ස්ථාවර බවක් සංඛ්‍යා ලේඛන අනුව දක්නට ඇති හෙයින් එම වර්ධන ප්‍රතිශතය ගැනීම සුදුසුය යන්න අපගේ මතයයි. මේ අනුව 1981 සිට 2012 දක්වා වූ වර්ෂ 30 ක වර්ධන ප්‍රතිශතය පහත සඳහන් අයුරින් ගණනය කළ හැක.

**1981 සිට 2012 දක්වා වූ සමස්ත ජනගහන වර්ධන ප්‍රතිශතය**

$$= \frac{\text{(2012 ජනගහනය - 1981 ජනගහනය)}}{\text{1981 ජනගහනය}} \times 100$$

$$= \frac{(20,263,723 - 14,846,700)}{14,846,700} \times 100$$

$$= 36\%$$

**1981 සිට 2012 දක්වා අවුරුදු 30 ක වාර්ෂික වර්ධන ප්‍රතිශතය** $= \frac{36}{30} = 1.2\%$

මෙම වර්ධන ප්‍රතිශතය වර්තමාන තත්ත්වයට සමීප එකක් හෙයින් එය වඩාත් යථාර්ථයට සමීප එකක් ලෙස සැලකිය හැක. මෙම වර්ධන ප්‍රතිශතය අනුව 2050 දී සමස්ත ජනගහනය කුමක් විය හැකි දැයි අපට ගණනය කළ හැක. මේ සඳහා සමාන්තර ශ්‍රේණි සමීකරණය උපයෝගී කර ගැනීමෙන් නිවැරදි ගණනය කිරීමක් කරන්නට හැකි වේ.

**2012 ජනගහනය = P**

**1981 සිට 2012 දක්වා වූ අවුරුදු 30ක වාර්ෂික වර්ධන ප්‍රතිශතය = Q**

**ගණනයට අදාළ වර්ෂ ගණන (-1) = R**

**මෙම ගණනයට අනුව 2050 සමස්ත ජනගහනය = S**

$$\frac{P+(PxQxR)}{100} = S$$

$$\frac{20,263,723 + (20,263,723 \times 1.2 \times 37)}{100} = 29,260,816$$

ඉහත ගණනය කිරීම් අනුව 1.2% ක ජනගහන වේගයක් පැවතියහොත් 2050 දී සමස්ත ජනගහනය 29,260,816 (මිලි. 29.26) ක් වනු ඇත. මෙම ජනගහනය 2012 වාර්ගික අනුපාතය අනුව බෙදුනු විට එය පහත සඳහන් අයුරු වේ. 2050 දී ද්‍රවිඩ ජනගහන ප්‍රමාණයේ වෙනසක් නොවී මුස්ලිම්වරුන් ඉතිරියෙන් 51% ක් වුවහොත් ඇති වන තත්ත්වය ද පහත වගුවෙන් දැක ගත හැක.

| 2012 වාර්ගික ජනගහන ප්‍රතිශතය පවත්වාගෙන ගියහොත් | | | ද්‍රවිඩ ජනගහනයේ වෙනසක් නොවී 2050 දී මුස්ලිම් ජනගහනය ඉතිරියෙන් 51% නම් | | | **2012 ට සාපේක්ෂව වෙනස** |
|---|---|---|---|---|---|---|
| වාර්ගිකත්වය | 2050 | 2012 - % | 2050 | % | වෙනස | |
| සිංහල | 21,910,499 | 74.88% | 12,128,345 | 41.45% | -9,782,154 | -5,391,666 |
| මුස්ලිම් | 2,841,225 | 9.71% | 12,623,379 | 43.14% | +9,782,154 | +7,814,927 |
| ද්‍රවිඩ | 4,509,092 | 15.41% | 4,509,092 | 15.41% | - | - |
| එකතුව | 29,260,816 | **100.00%** | 29,260,816 | **100.00%** | | |

2050 දී මුස්ලිම් 51% නම් එම සංඛ්‍යාව

= (සමස්ත ජනගහනය - ද්‍රවිඩ ජනගහනය) X 51%

= (29,260,816 - 4,509,092) X 51%

= 12,623,379

2050 දී සිංහල 49% නම් එම සංඛ්‍යාව

= (සමස්ත ජනගහනය - ද්‍රවිඩ ජනගහනය) X 49%

= (29,260,816 - 4,509,092) X 49%

= 12,128,345

වඩාත් යථාර්ථවාදී වර්ධන ප්‍රතිශතයක් උපයෝගී කර ගනිමින් 2050 දී මුස්ලිම් වරුන් රටේ බහුතරය වීමට නම් 2012 සිට

$\frac{7,814,927}{1,967,227}$ X 100 = 397.26% වලින් වර්ධනය විය යුතුය.

අනිත් අතින් සිංහල ජනගහනය 2012 සිට

$\frac{-5,391,666}{15,173,820}$ X 100 = -35.53% වලින් අව වර්ධනයක් සිදු විය යුතුය.

**මෙය සහමුලින්ම අතාත්වික හා යථාර්ථයට පටහැනි තත්ත්වයන් දෙකකි.** මේ අනුව මුස්ලිම්වරුන් පිළිබඳ මතු කර ඇති ජනගහන භීතිකාව සම්පූර්ණයෙන්ම පදනම් විරහිත සත්‍යයෙන් බැහැර වූ ප්‍රචාරක අවියක් හැරෙන්නට අන් කිසිවක් නොවන බව බුද්ධිමත් ජනයාට පහසුවෙන් අවබෝධ කර ගැනීමට හැකි වේ යැයි විශ්වාස කරන්නෙමු.

## චෝදනා අංක 4

### 1. ත්‍රිකුණාමලය හා වවුනියාව දිස්ත්‍රික්කයන්හි අසාමාන්‍ය මුස්ලිම් ජනගහන වර්ධනය

"දෙමළ ජනගහනයේ බරපතලම අඩුවීම පෙන්නුම් කරන්නේ ත්‍රිකුණාමලය හා වවුනියාව යන දිස්ත්‍රික්ක වල වන අතර එම ප්‍රතිශත වෙනස්වීම් පිළිවෙලින් 15.8% හා 10.8% වේ. මුස්ලිම් ජනගහන ප්‍රතිශතය ඉතාම සුළු වශයෙන් අඩු වී ඇත්තේ අනුරාධපුරය හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක වල පමණි. දෙමළ ජනගහන ප්‍රතිශතය දැඩි ලෙස අඩු වූ ත්‍රිකුණාමලය හා වවුනියාව දිස්ත්‍රික්ක වල මුස්ලිම් ජනගහන ප්‍රතිශතය 12.2% කින් හා 5.6% කින් ඉහළ යෑම විශේෂත්වයකි."


## පැහැදිලි කිරීම

මෙම චෝදනාව තුළම එහි පිළිතුර අන්තර්ගතව ඇත. එනම් නිශ්චිත ප්‍රදේශයක එක් වාර්ගිකත්වයක ප්‍රතිශතය අඩු වන විට අනෙකුත් වාර්ගිකයින්ගේ ප්‍රතිශතය වැඩිවීම ගණිතමය වශයෙන් අනිවාර්යයෙන්ම සිදු විය යුත්තක් බව බුද්ධිමත් ඕනෑම අයෙකුට පහසුවෙන් අවබෝධ කර ගත හැකි කරුණකි. මෙම පදනම අතහැර ත්‍රිකුණාමලය සහ වවුනියා දිස්ත්‍රික්කයන් හි මුස්ලිම්වරුන් තම ජනගහන ප්‍රතිශතය පිළිවෙලින් 12.2% කින් හා 5.6% කින් අසාමාන්‍ය වර්ධනයක් ඇති කර ගැනීම පිණිස විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඇති බවට වක්‍ර ඇඟවීමක් කර තිබීම කිසිසේත්ම පිළිගත හැකි කරුණක් නොවන බව අවධාරණයෙන් පවසන්නට කැමැත්තෙමු.

මේ පිළිබඳව එම ප්‍රදේශයේ වගකිව යුත්තන්ගෙන් අපි කරුණු විමසා බැලුවෙමු. තම්පලාගම, කුච්චවේලි, මූතූර්, ත්‍රිකුණාමල නගරය යන ප්‍රදේශයන් හි ග්‍රාමසේවා වාර්තා අනුව බහුතරයක් වූයේ ද්‍රවිඩ ජනයාය. නමුත් එම ප්‍රදේශයට එල්.ටී.ටී.ඊ. තර්ජන වැඩි වෙත්ම එහි සිටි ද්‍රවිඩ ජනයා එල්.ටී.ටී.ඊ. බලය ස්ථාපිත ව තිබූ මුලතිව් ප්‍රදේශයටත් තවත් විශාල පිරිසක් ඉන්දියාවටත් යුරෝපීය මෙන්ම කැනඩාව වැනි රටවල් වලටත් සංක්‍රමණය වී ඇත. වවුනියාවේ තත්ත්වය ද මෙයට සමාන එකකි. මෙම තත්ත්වය සනාථ කරන සාක්ෂි මෙම ප්‍රදේශයන් හි අදත් දැක ගත හැක. ඉහත ප්‍රදේශයන් හි අතහැර දමා ඇති හින්දු කෝවිල් ප්‍රමාණය මෙයට කදිම නිදසුනකි. ද්‍රවිඩ ජනයා එම ප්‍රදේශයෙන් සංක්‍රමණය වීම හේතුවෙන් ඔවුන්ගේ ජනගහන ප්‍රතිශතය අඩු වීමට හේතු වූ බව මෙයින් පැහැදිලි ව අවබෝධ වේ යැයි අපි විශ්වාස කරන්නෙමු.

අනිත් අතින් මෙම ප්‍රදේශයන්ට එල්.ටී.ටී.ඊ. තර්ජනය ඇති වූ විට එම ප්‍රදේශයන් අතහැර නොගොස් එල්.ටී.ටී.ඊ. ය පරාජය කිරීමට අවශ්‍යය සියලු උපකාරයන් සන්නද්ධ හමුදාවන්ට ලබා දුන්නේ එම ප්‍රදේශයේ විසූ මුස්ලිම් ජනයා ය. විශේෂයෙන් ම මූතූර් හි විසූ මුස්ලිම් ජනයාට එල්.ටී.ටී.ඊ. යෙන් අති විශාල තර්ජන මෙන්ම පහරදීම් ද සිදු විය. මේ සියල්ල ඉදිරියේ ආරක්ෂක අංශයේ විශේෂ ඉල්ලීමට එකඟව රටේ යහපත වෙනුවෙන් මුස්ලිම් ජනයා එම ප්‍රදේශය අතහැර නොගොස් රැඳී සිටීමට තීරණය කළහ. මේ හේතුවෙන්ම එල්.ටී.ටී.ඊ.ය මූතූර් ප්‍රදේශයෙන් පසු බැස්ස අතර ඔවුන්ගේ පරාජයේ ආරම්භය සනිටුහන් වූයේ මෙම පසුබැසීමත් සමගය. මෙලෙස රටේ යහපත වෙනුවෙන් පරිත්‍යාගශීලීව කටයුතු කළ එම ප්‍රදේශයේ මුස්ලිම් ජනයා පිළිබඳව වක්‍ර ලෙස හෝ ආන්දෝලනාත්මක ඇඟවීමකින් කරුණු ඉදිරිපත් කිරීම කොතෙක් සදාචාර සම්පන්නද යන්න පිළිබඳව කරුණාකර සිතා බලන්න.

## ජනවාර්ගිකරණය අනුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි ජනගහන ව්‍යාප්තිය 2012





ද්‍රවිඩ ජනයා මෙම ප්‍රදේශයන්ගෙන් සංක්‍රමණය වූ හේතුවෙන් ඔවුන්ගේ ජනගහන ප්‍රතිශතය අඩු වූ අතර එම හේතුව නිසාම සංඛ්‍යාත්මක වැඩි වීමට වඩා ප්‍රදේශයේ රැඳී සිටි මුස්ලිම් ජනයාගේ ජනගහන ප්‍රතිශතය වැඩිවීම අංකගණිතයේ ඉතාම මූලික කරුණු දන්නා කෙනෙකුට වුව ද අවබෝධ කර ගත හැකි සරල කරුණකි. මෙවන් පදනම් විරහිත චෝදනා මගින් 'මුස්ලිම් භීතිකාවක්' ඇති කිරීමට කටයුතු කිරීම කොතෙක් සදාචාර සම්පන්න ද යන්න ගැන කරුණාකර සිතා බලන්න.

## 2. අම්පාර මුස්ලිම් ජනගහන වර්ධනයේ විශේෂත්වය

"බෞද්ධ ජනගහනය 1.1% කින් කැපී පෙනෙන ලෙස අඩු වූ අම්පාරේ **ඉස්ලාම් ජනගහනය 2.3% කින් වර්ධනය වීම විශේෂත්වයකි."**

### පැහැදිලි කිරීම

ඉහත ඡේදයේ ප්‍රධානතම චෝදනාව ලෙස හුවා දක්වා ඇත්තේ 'අම්පාරේ ඉස්ලාම් ජනගහනය 2.3% කින් වර්ධනය වීම' යන කොටසය. තවද මෙය අම්පාර දිස්ත්‍රික්කයේ සිංහල ජනගහන ප්‍රතිශතය අඩුවීම පිළිබඳව ඇති සටහනකි. අප යම් අදහසක් ඉදිරිපත් කරන අවස්ථාවක එයට පාදක වූ හේතු පිළිබඳව කරුණු නොදක්වා සිටියේ නම් එය පාඨකයා නොමග යැවීමකි. අම්පාර දිස්ත්‍රික්කයේ සිංහල ජනගහන ප්‍රතිශතය අඩු වීමේ ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ 2007 - ඔක්තෝබර් - 10 වැනි දින ජනගහන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් 'අම්පාර දිස්ත්‍රික්කයේ 2007 වර්ෂයේ මූලික ජනගහන තොරතුරු' නමින් නිකුත් කර තිබූ වාර්තාවේ 17 වැනි පිටුවේ සඳහන් තොරතුරු මගිනි. එම ඉංග්‍රීසි වාර්තාවෙන් උපුටා ගත් තොරතුරු පහතින් දක්වා ඇත්තෙමු. එම වාර්තාවේ මෙම ප්‍රශ්නයට අදාළ කොටසට යටින් ඉරි ඇඳ ඇති අතර එම කොටස සිංහලට පරිවර්තනය කොට පහතින් ඉදිරිපත් කොට ඇත්තෙමු.



දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයෙන් කොටසක් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිඹුලාගල ප්‍රාදේශීය බල ප්‍රදේශයට ඒකාබද්ධ කිරීම දැක්වෙන සිතියම

"Number and percentage distribution of population by ethnicity from 1963 to 2007 is shown in Table G. It is seen that 44.0 percent of the population in Ampara district are Sri Lanka Moors in 2007. Sinhalese and Sri Lanka Tamil comprises of 37.5 percent and 18.3 percent respectively. (See Figure D). There is a slight increase in the percentage of Sri Lanka Moor, and a decrease of percentage of Sinhalese in comparison to 2001 Census figures. A major reason for the above changes is the amalgamation of part of Dehiattakandiya DS division in Ampara district to Dimbulagala DS division in Polonnaruwa district, after the Population Census 2001". ('Basic Population Information – 2007 – Ampara District – Page 17 – Department of Census and Statistics)

"2001 වර්ෂයේ සංගණන දත්තයන්ට සාපේක්ෂව ශ්‍රී ලංකා යෝනකයින්ගේ ප්‍රතිශතයේ සුළු වර්ධනයක් ද සිංහලයින්ගේ ප්‍රතිශතයේ අඩුවක්

ද දක්නට ඇත. මෙම වෙනසට එක් ප්‍රධාන හේතුවක් නම් අම්පාර දිස්ත්‍රික්කයට ඇතුළත්ව තිබූ දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයෙන් කොටසක් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිඹුලාගල ප්‍රාදේශීය බල ප්‍රදේශයට ඒකාබද්ධ කිරීමය"

දෙහිඅත්තකණ්ඩිය බහුතරයක් සිංහල ජනයා ජීවත්වන ප්‍රදේශයකි. එයින් කොටසක් අම්පාර දිස්ත්‍රික්කයෙන් ඉවත් කිරීම හේතුවෙන් අම්පාර දිස්ත්‍රික්කයේ සිංහල ජනගහන ප්‍රතිශතයේ අඩුවීමක් සිදු වන අතර මෙම අඩුවීම හේතුවෙන් මුස්ලිම් ජනගහන ප්‍රතිශතය වැඩි වීම අරුමයක් ලෙස දකින්නට අවශ්‍යතාවක් කිසිවෙකුටවත් තිබිය නොහැක.

**මේ ප්‍රදේශයන් ඒකාබද්ධ කිරීමම පොළොන්නරු දිස්ත්‍රික්කයේ මුස්ලිම් ජනගහන ප්‍රතිශතය අඩුවීමටත් සිංහල ජනගහන ප්‍රතිශතය වැඩිවීමටත් හේතුවක් වී ඇති බව පැහැදිලිය.**

ඉහත කරුණු සියල්ල සමස්තයක් වශයෙන් ගෙන සමාලෝචනය කිරීමේ දී ජනගහන ප්‍රශ්නය ගෙනහැර දක්වමින් 'මුස්ලිම් භීතිකාවක්' ගොඩ නැගීමට වෙර දැරීම පදනම් විරහිත එමෙන්ම හුදෙක් වෛරය හා ක්‍රෝධය පදනම් කරගත් ක්‍රියාවක් ද යන්න පිළිබඳව අපට සැකයක් මතුව ඇත. එය රටේ අභිවෘද්ධියට වින කරණ විදේශීය බලවේග සමඟ එක්ව කරන කුමන්ත්‍රණයක් ද යන්න අපට පැන නැගී ඇති බරපතල ප්‍රශ්නයකි.

බෙදුම්වාදී ත්‍රස්තවාදී ගැටුම් අවසන් වී වර්ෂ කිහිපයක් ගත වුවද එම ගැටුම්කාරී දශක තුනේ ගොඩනැගුනු වෛරය, අවිශ්වාසය හා එකිනෙකා කෙරෙහි වන බිය ඉවත් කිරීමට කටයුතු කිරීම ශ්‍රී ලාංකේය සැමගේ වගකීමක් ලෙස අපි දකින්නෙමු. මෙය රටේ සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමට විශාල ශක්තියක් වනු ඇත.

ජන විඥාණයේ හා හදවත් වල විනිවිද ගිය මෙම තුවාල සුවපත් කරන්නේ කෙසේද යන්න සැමට අභියෝගයක්ව පවතී. මෙලෙස රෝගාතුර වී ඇති ජන විඥාණය සුවපත් කොට වෛරයෙන්, බියෙන්, සැකෙන්, අවිශ්වාසයෙන් තොර වූ සමාජයක් නිර්මාණය කිරීම පිණිස ලක් මවගේ සියලු දරුවන් එකට අත්වැල් බැඳගෙන කටයුතු කළ යුතු කාලය දැන් එළැඹ තිබෙනවා නොවේ ද?

තමන්ගේ ආගමික හා වාර්ගික අනන්‍යතාවය රැක ගනිමින් හා අන් අයගේ ආගමික හා වාර්ගික අනන්‍යතාවයට ගරුකරමින් කටයුතු කරන ශ්‍රේෂ්ඨ ආදර්ශමත් රටක් ලෙස අපගේ මාතෘ භූමිය ගොඩනගමු.

අන්‍යෝන්‍ය අවබෝධය ගොඩ නැගීම පදනම් කරගෙන සකස් කෙරෙන මෙම 'සමාජ සංවාද' ලිපි පෙළෙන් අප අපේක්ෂා කරන්නේ ශ්‍රී ලාංකේය සැමට සුහදත්වය සාමය හා සහෝදරත්වයෙන් සපිරි අලංකාර සමාජ පරිසරයක් ගොඩ නැගීමටය. මෙම උදාර අපේක්ෂාව සාක්ෂාත් කර ගැනීම පිණිස කරුණාකර අප සමග අත්වැල් බැඳ ගන්නා ලෙස ගෞරවපූර්වකව ආරාධනා කරන්නෙමු.